දකුණු පළාත් සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දකුණු පළාත් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2025 ජුනි 25 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දකුණු පළාත් සභා අරමුදල

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ දකුණු පළාත් සභා ආයතන 02ක් වෙත රු.123,000,000ක මුදලක් ගෙවූ ලෙස වැරදියට සටහන්ව තිබීම සහ ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර වැඩසටහන යටතේ අග්‍රිම පියවීම් රු.8,696,308ක් හා වැඩසටහන් 02ක් වෙනුවෙන් ලද රු.10,153,959ක මුදලක් භාණ්ඩාගාරයට ආපසු හරවා යැවීම් සමාලෝචිත වර්ෂයේ වෙනත් ගෙවීම් යටතේ දක්වා තිබීම නිසා වර්ෂයේ වියදම රු.141,850,267කින් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී මෙවැනි දෝෂ නොවීමට ක්‍රියා මාර්ග ගෙන ඇති බව.	වියදම නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කල යුතුය.

(ii)	දකුණු පළාත් සභාවේ ආයතන 10 ක් සතු රු.386,664,286ක් වූ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම ගිණුම්ගත කර නොතිබූ අතර ආයතන 07ක් සතු රු.355,554,768ක්වූ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.262,467,344ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.479,751,710කින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	දේපළ, පිරියත හා උපකරණවල නිවැරදි වටිනාකම ගිණුම්ගත කල යුතුය.

1.2.2 නොසැසඳූ පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් අරමුදල් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වූ ජංගම වගකීම් යටතේ දක්වා තිබූ පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිවෙලින් රු.1,121,074,823ක් හා රු.65,320,913ක් වූ අතර අදාළ පළාත් පාලන ආයතන විසින් සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම අගයන් පිළිවෙලින් රු.2,373,348,436ක් සහ රු.148,204,932 ක් විය. ඒ අනුව උසාවි දඩ හා මුද්දර ගාස්තුවල එකතුව රු.1,335,157,632ක වෙනසක් නිරීක්ෂණය විය.	පළාත් පාලන ආයතන විසින් උප ලේඛන නිකුත් කරනු නොලැබූ මාස සඳහා අයවැය ලේඛනයේ මුද්දර ගාස්තු හා උසාවි දඩ සඳහා වෙන් කර ඇති ප්‍රමාණය පදනම් කරගනිමින් ඇස්තමේන්තු අගයන් ගනු ලබන බැවින් මෙම වෙනස හටගෙන ඇති බව.	ශේෂ සැසඳීමට ලක්කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව දකුණු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 300 - දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

(අ) මතභේදයට තුඩුදුන් ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2023 නොවැම්බර් 19 දින සිට දින 4කදී 24 වන අන්තර් දූපත් සංචාරක ප්‍රතිපත්ති සමුළුව පැවැත්වෙන බව දක්වා දකුණු පළාත් සභාවට පමණක් එවා තිබුණු ඊ මේල් පණිවිඩය පදනම් කර ගෙන ආණ්ඩුකාරවර ඇතුළු ආණ්ඩුකාර ලේකම් කාර්යාලය නියෝජනය කරමින් නිලධාරීන් සිව්දෙනෙකු, ආණ්ඩුකාරවරගේ පෞද්ගලික ලේකම් සහ පෞද්ගලික ආයතනයක කළමනාකරණ අධ්‍යක්ෂවරයෙකු සහභාගී වීම වෙනුවෙන් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය විසින් රු.3,001,106ක මුදලක් වැයකර තිබුණද එම සමුළුවට සහභාගී වීමෙන් ලද දැනුම, එළඹි ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව කිසිදු වාර්ථාවක් මෙතෙක් ලබාදී නොතිබුණි. තවද, දකුණු පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ රීති 2.1(2) ප්‍රකාරව පළාතක පළාත් සභා අරමුදලින් කිසිම මුදලක් 1987 අංක 42 දරන පළාත් සභා පනතෙහි විධිවිධානවලට පටහැනිව වියදම් කළ නොහැකි වුවද, පෞද්ගලික ආයතනයක කළමනාකරණ අධ්‍යක්ෂවරයකු පළාත් සභා අරමුදලින් වියදම් දරමින් මෙම සංචාරයට සහභාගී වී තිබුණ අතර සමුළුවට සහභාගීවන පිරිස සඳහා ආහාරපාන ලබා දෙන බව දන්වා තිබියදීත් 2023 මාර්තු 20 දිනැති මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF/06/23/50/2023 දරන උපදෙස් ලිපියේ 02(III) වගන්තියට පටහැනිව සංග්‍රහ වියදම් දීමනා ලෙස ඇමරිකානු ඩොලර් 750ක මුදලක් එනම් රු.245,393 ක් ආණ්ඩුකාරවර වෙත ගෙවීම් කර තිබුණි.	ආණ්ඩුකාරවර විසින් සමුළුව සඳහා සම්බන්ධවන නිලධාරීන් නම්කර තිබූ බවත් ITOP වැඩසටහනට සමගාමීව ව්‍යාපාරික සමුළුවක්ද පැවති අතර ඒ සඳහා පළාතේ ව්‍යවසායක සහභාගීත්වය අවශ්‍ය බැවින් දකුණු පළාතේ සංචාරක ව්‍යාපාරය සඳහා විශාල දායකත්වයක් ලබා දෙන හා ව්‍යාපාර කටයුතු වල නියුතු ව්‍යාපාරිකයකු සහභාගී කරගත් අතර අදාල විදේශ ගමන සංවිධාන කටයුතු පහසු කර ගැනීමට එම මුදල රජය විසින් ගෙවන ලද මුත් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර ඇති බවත් මේ සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදු වී නොමැති බවත් 2023 මාර්තු 26 දිනැති මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF/06/23/50/2023 දරන උපදෙස් ලිපිය මගින් විදේශ ගමන් දීමනා සීමාකර ඇති නමුත් එම චක්‍රලේඛයේ 2: iii ජේදය පරිදි දූත පිරිසෙහි නායකත්වය දරන අමාත්‍යවරයාට හෝ ලේකම්වරයාට ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 750 ($) ක් ගෙවිය හැකි බැවින් එම මුදල් ගෙවා ඇති බව හා ආණ්ඩුකාරවරගේ සහ ආණ්ඩුකාරවර සම්බන්ධීකරණ ලේකම්ගේ විදේශ ගමන් සඳහා පූර්ණ පිරිවැය ප්‍රදායක ආයතනය විසින් දරා ඇති බව.	දකුණු පළාත් මූල්‍ය රීති සංග්‍රහය හා උපදෙස් ලිපියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) නොවිසඳී ඇති විගණන ඡේද

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ නිල වාහන සම්බන්ධ පරීක්ෂාව		
(ඒ) ජනාධිපති ලේකම්ගේ 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PC/CSA/11-18 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය හා 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008(VI) දරන සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ආණ්ඩුකාරවර මහජන සම්බන්ධතා නිලධාරී වෙත අනුයුක්ත කරන ලද රථය සඳහා 2023 ජනවාරි සිට අගෝස්තු දක්වා මසකට ඉන්ධන ලීටර් 213 බැගින් ඉන්ධන ලීටර් 1704ක් වෙනුවෙන් රු.601,512ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබියදී එම කාලපරිච්ඡේදය තුළ මහජන සම්බන්ධතා නිලධාරී ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වෙනුවෙන් ගමන් කළ දින 119න් දින 118ක් වෙනුවෙන් සිය තනතුරට වෙන්කළ වාහනය යොදාගෙන නොතිබූ අතර ධාවනය සඳහා ආණ්ඩුකාරවර නිලරථ හෝ ආණ්ඩුකාරවර ආරක්ෂක රථය යොදා ගෙන තිබුණි. කෙසේ වුවද පළාත් සභා අරමුදල් වලින් ආණ්ඩුකාරවර වෙතද ආණ්ඩුකාරවර ආරක්ෂක රථය වෙනුවෙන් එම කාල සීමාව සඳහාම මසකට ලීටර් 495 ක් බැගින් ලීටර් 3960ක් වෙනුවෙන් රු.1,397,880ක් ගෙවා තිබුණි.	ජනාධිපති ලේකම් විසින් රාජ්‍ය වියදම් කළමනාකරණය යටතේ නිකුත් කරන ලද ජනාධිපති චක්‍රලේඛ විධිවිධාන පරිදි මහජන සම්බන්ධතා නිලධාරී භාවිතා කරන නිලරථය සඳහා මාසික ඉන්ධන දීමනාවක් ගෙවා ඇත. එමෙන්ම ආණ්ඩුකාරවර වෙතද එම චක්‍රලේඛයේම ප්‍රතිපාදන පරිදි ආණ්ඩුකාරවර ආරක්ෂක රථ වෙනුවෙන් චක්‍රලේඛයේ සඳහන් ඉන්ධන ලීටර ප්‍රමාණය සඳහා මාසික ඉන්ධන දීමනාවක් ගෙවීම සිදු කර ඇති බව හා ආණ්ඩුකාරවරගේ උපදෙස් මත හා රාජකාරී කටයුතු පහසුව සඳහා මහජන සම්බන්ධතා නිලධාරී ආණ්ඩුකාරවර නිල රථයේ හෝ පරිවාරක රථයේ ගමන් කිරීම ඇතැම් අවස්ථා වල සිදු කර ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(බී) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 01 පරිදි ආණ්ඩුකාරවර සංචිතයේ පැවති ජීප් රථයක් සඳහා 2022 ජනවාරි මස පමණක් ධාවන	එම රථය සඳහා අනුයුක්ත රියදුරකු නොමැති අතර, ආණ්ඩුකාරවර නිල රථය ඇතුළු පරිවාරක රථ 3 හා මහජන සම්බන්ධතා නිලධාරී වෙත වෙන් කළ රථය ඇතුළු වාහන 4	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

	සටහන් ඉදිරිපත් කර තිබූ අතර කිලෝමීටර් 4164 ක දුරක් ධාවනය වෙනුවෙන් ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.	සඳහා රියදුරන් දෙදෙනෙක් පමණක් යොදවා ඇත. බොහෝ අවස්ථාවලදී රාජකාරී කටයුතු වලදී ආණ්ඩුකාරවර පරිවාරක රථ ධාවනය කිරීම සඳහා දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් රියදුරන් තාවකාලිකව අනුයුක්ත කරගන්නා අතර, එවකට සිටි රියදුරන් දෙදෙනා වාහන 4 හි අවස්ථානුකූලව ධාවන කටයුතු සිදු කර ඇති බව.	
(ii)	2019 මැයි 02 දිනැති හා 2020 ජනවාරි 15 දිනැති දකුණු පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි 2019 ජුනි 25 දින සිට මසකට රු.75,000 ක දීමනාවක් හා අමාත්‍යාංශයක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුට හිමි වරප්‍රසාද යටතේ 2019 ජුනි 25 දින සිට ආණ්ඩුකාර උපදේශකවරයකු පත්කර තිබුණි. එකී උපදේශකවරයා වෙත 2019 ජුනි 25 සිට 2023 අගෝස්තු 31 දින දක්වා ඉන්ධන දීමනාව වශයෙන් රු.3,203,409ක් ගෙවා තිබුණි. තවද ආණ්ඩුකාර උපදේශකවරයකු ලෙස සේවය කරමින් සිටියදීම 2020 මාර්තු 18 දින දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙසද පත්කර තිබූ අතර එදින සිට 2023 අගෝස්තු 31 දින දක්වා රු.1,166,838ක දීමනා ගෙවීම් කර තිබූ අතර එම තත්ත්වය එසේම තිබියදී එම උපදේශකවරයාම වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂ තනතුරක් සඳහා පත් කර තිබුණි. එසේම ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් නිල වාහනයක් හා ඉන්ධන දීමනාව ලබාගෙන තිබියදී තවදුරටත් එකී උපදේශකවරයා ගාලු උරුමය පදනමෙන් මෝටර් කාර් රථයක් භාවිතා කර තිබූ අතර එම වාහනය සඳහාත් 2021 ජූලි මස සිට වසරක කාලයක් සඳහා ඉන්ධන ලබාගෙන තිබුණි. ඒ අනුව 2019 ජුනි මස සිට 2023 අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුල ආයතන 03ක	ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අදාල නිලධාරියා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික තනතුරට පත් කර ඇති අතර අදාළ තනතුරට හිමි දීමනා සහ අනෙකුත් ගෙවීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කර ඇති බව හා පළාත් සභාවල පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය විසින් සිදු කරන ලද සියළුම රාජකාරි පළාත් ආණ්ඩුකාරවරුන් වෙත පැවරී ඇති බැවින් එම රාජකාරි සඳහා ආණ්ඩුකාරවරට සහය වීම සඳහා උපදේශකවරුන් පත් කිරීම ඍජුවම ආණ්ඩුකාරවර උපදෙස් අනුව කළ යුතු බව හා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව ආණ්ඩුකාර උපදේශක තනතුරේ රාජකාරී කටයුතු කිරීම වෙනුවෙන් එක් වාහනයක් ලබා දී ඇති බව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා ගාලු උරුමය පදනම සඳහා වන දීමනා සහ අනෙකුත් ගෙවීම් සිදු කරනු ලබන්නේ මෙම කාර්යාලයෙන් නොවන බව.	අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි කටයුතු කල යුතුය.

සේවය කිරීම සහ එයින් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් හා ගාලු උරුමය පදනමින් ඉන්ධන ලබාගෙන තිබීම නිවැරදි තත්ත්වයක් නොවන බව නිරීක්ෂණය වේ.

1.5.2 ශීර්ෂය 301 - දකුණු පළාත් සභා ලේකම් කාර්යාලය

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/ CSA/11-18 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛ	සභාපතිගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ කළමනාකරණ සහකාර තනතුර සඳහා 2022 දෙසැම්බර් 01 දින පත්වීම් ලබාදී තිබූ තැනැත්තාට එදිනට වයස අවුරුදු 58 මාස 08ක් සම්පූර්ණවී තිබුණ අතර ඒ අනුව කළමනාකරණ සහකාර සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ උපරිම වයස් සීමාව වන වයස අවුරුදු 30ක සීමාව ඉක්මවා තිබියදී අදාළ පත්වීම ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ වී තිබුණද, 2022 දෙසැම්බර් මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස දක්වා එකතුව රු.1,031,125 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.	2023 වර්ෂයේ මාර්තු වන විට වයස අවුරුදු 60 ක් බව පිළිගෙන ඇති අතර ඔහුගේ තනතුර හුදෙක් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් නොවන බැවින් හා පළාත් සභා සම්බන්ධ සභාපතිවරයාගේ රාජකාරී ඉටු කිරීම පිළිබඳ තනතුරක් බැවින් බඳවා ගැනීමේ චක්‍රලේඛය සම්බන්ධයෙන් එතරම් අවධානයක් යොමු නොකර බඳවා ගැනීම සිදු කර ඇති බව හා මේ වන විට එම නිලධාරියාට වැටුප් ගෙවීම අත්හිටුවා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	1987 අංක 42 දරන පළාත් සභා පනතේ II කොටසේ 7.2 උප වගන්තියෙහි සභාව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීම වන තෙක් සභාපතිවරයාගේ ධූර කාලය පවතින බව සඳහන් වේ. ජනාධිපති ලේකම්ගේ 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/ CSA/11-18 දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුව පළාත් සභාවේ සභාපතිවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පහසුකම් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ සඳහන් සීමාවන් යටතේ කටයුතු කලයුතු වුවද, දකුණු පළාත් සභාවේ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලය ලෙස 10 දෙනෙකු වෙත පත්වීම් ලබාදී තිබූ අතර 2022 ඔක්තෝබර් 28 දිනැති ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/00/1/4/2 (2) දරන චක්‍රලේඛය මගින් පෞද්ගලික කාර්ය මණ්ඩලය 06 දෙනෙකු දක්වා අඩුකර තිබුණි. දකුණු පළාත් සභාව 2019 අප්‍රේල් 10 දින සිට විසුරුවා හැර තිබූ අතර එදින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා සභාපති වෙත වැටුප් හා දීමනා ලෙස රු.15,538,305 ක්ද, ඔහුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ඉටුකළ රාජකාරීන් හා පැමිණීම සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් නොතිබියදී වැටුප් හා දීමනා ලෙස රු.33,407,601 ක්ද සහා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.	දකුණු පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු ගිණුම් කාරක සභා පසු විපරම් කටයුතු 2022 වර්ෂයේද පෙත්සම් කාරක සභා පසු විපරම් කටයුතු 2023 වර්ෂයේද ආරම්භ කළ අතර ගිණුම් කාරක සභා පසු විපරම් සභාපතිතුමාගේ ප්‍රධානාත්වයෙන් හා පෙත්සම් කාරක සභා පසු විපරම් ආණ්ඩුකාරවරගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන බව හා සභාපතිතුමගේ කාර්යාලය ගැටමාන්න ප්‍රදේශයේ එතුමාගේ පෞද්ගලික නිවසේ පවත්වාගෙන යන බැවින් සභා ලේකම් කාර්යාලයෙහි අත්සන් තැබීමක් සිදුනොවන බව.	පළාත් සභා පනත හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ii)	දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)ගේ 2019 සැප්තැම්බර් 17 දිනැති සහා ලේකම් ඇමතූ අංක 1/9/2/17/2019 දරන ලිපිය පරිදි සභා ලේකම් කාර්යාලයේ ඉදිකර තිබූ ජල කුළුණේ ව්‍යුහයේ පලුදු වී ඇති කණු හා තලාද වල එම කොටස් සම්පූර්ණයෙන් ඉවත් කර නියමිත ප්‍රමිතියට අනුව නැවත පිළිසකර කිරීම සඳහා මොරටුව විශ්ව	ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් පරීක්ෂණ සඳහා විශාල මුදලක් හා කාලයක් ගතවන බව බැවින් එහි 3.4 ඡේදයෙහි නිර්දේශ දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) වෙත ඉදිරිපත් කර ඒ අනුව ඇස්තමේන්තු කැඳවා අදාල අලුත්වැඩියාවන් එම ආයතනයේ	ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කල යුතුය.

	විද්‍යාලය හෝ පිළිගත් ආයතනයකින් ව්‍යුහාත්මක අලුත්වැඩියා (structural repairs) පිළිබඳව නිර්දේශ වාර්තාවක් ලබා ගෙන ප්‍රතිස්ථාපනය කිරීම යෝග්‍ය වන බව දක්වා තිබුණි. ඒ අනුව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය වෙතින් ලබා දී තිබූ නිර්දේශ ක්‍රියාත්මක නොකර ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියක් මඟින් රු.512,100 ක වියදමක් දරා අදාළ ඉදිකිරීම කර තිබූ අතර මෙම අළුත්වැඩියාව කොන්ක්‍රීට් හා කම්බි සම්බන්ධයෙන් වූ ව්‍යුහාත්මක අසමත් වීමක් (Structural Failure) බැවින් එවැනි විශේෂ කාර්යයක් ඉටු කිරීමට ග්‍රාම සංවර්ධන සමිතියකට ඇති ශක්‍යතාවය විගණනයට තහවුරු නොවූ අතර 2014 ඔක්තෝබර් 14 දින ඉදිරිපත් කර තිබූ මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු අංශයේ SPC/R/1/1/(ii)/CB/3/2/4/002 අංක දරන යොමුගත ගොඩනැගිල්ල පිළිබඳ වාර්තාවේ 34 පිටුවේ E8 යටතේ A හා B ගොඩනැගිලි දෙකින් A ගොඩනැගිල්ල ධාරිතාවය වැඩි බවත් A හා B ගොඩනැගිලි 02 අතර පැල්මක් (පළුද්දක්) ඇති බවත් නිරීක්ෂණය කර තිබීම මත ගොඩනැගිලිවල ශක්තිමත් බව පිළිබඳ ගැටළු සහගත බවක් ඇති බව අනාවරණය වී තිබුණි.	පූර්ණ අධීක්ෂණය හා ඔවුන්ගේ උපදෙස් අනුව සිදු කල බව හා දීර්ඝකාලීන ස්ථායීතාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව.	

(ඇ) නොවිසඳී ඇති විගණන ඡේද

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දකුණු පළාත් සභා සභාපතිතුමා වෙත සෞඛ්‍ය වෛද්‍ය රක්ෂණාවරණයක් ලබාදීම. ජනාධිපති ලේකම්ගේ 2022 සැප්තැම්බර් 27 දිනැති අංක PS/CSA/11-18(I) හා 2022 ඔක්තෝබර් 28 දිනැති අංක PS/CSA/11-18(II) දරන රාජ්‍ය වියදම් කළමනාකරණය - පළාත් සභා චක්‍රලේඛ මඟින් පළාත් සභා සභාපතිවරුන් වෙත ගෙවිය හැකි දීමනා පිළිබඳව පැහැදිලිව දක්වා තිබියදී සහ 2022 වර්ෂයේදී රටේ පැවති මූල්‍ය අර්බුද හමුවේ ජනාධිපති	දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් 2011 අප්‍රේල් 20 දින ඉදිරිපත් කර තිබූ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණ 566 පරිදි සභාපතිවරයාගේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර ආණ්ඩුකාරවරගේ අනුමැතිය	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

	ලේකම් විසින් පළාත් සභාවල රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම සඳහා ඉහත සඳහන් චක්‍රලේඛ මගින් වියදම් සීමා කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී තිබියදී දකුණු පළාත් සභාවේ සභාපති වෙත වෛද්‍ය රක්ෂණාවරණයක් ලබාදීම සඳහා පළාත් සභා අරමුදලින් රු.104,818ක මුදලක් ගෙවා තිබුණි.	පරිදි දකුණු පළාත් සභාපතිතුමාගේ 2023 වර්ෂය සඳහා වූ වාර්ෂික වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා අරමුදල් වැය කල බව.	
(ii)	2010 අගෝස්තු 09 දිනැති දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/57 වෙළුම 01 දරන ලිපියට අනුකූල නොවන පරිදි 2020 අගෝස්තු මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා කාලයට අදාළව දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට නිවසක් කුලියට ගැනීම වෙනුවෙන් රු.1,350,000 ක දීමනාවක් සභා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.	2022 වර්ෂයේ නිකුත් කරන ලද පීඑස්/සීඑස්ඒ/11-18(1) හා පීඑස්/සීඑස්ඒ/11-18 (11) චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව.	උපදෙස් ලිපි අනුව කටයුතු කල යුතුය.
(iii)	2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 චක්‍රලේඛයේ 1 වන ඡේදය ප්‍රකාරව පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව කාර්යාල දීමනා ගෙවිය නොහැකි වුවද දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට 2019 ඔක්තෝබර් මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා කාර්යාල දීමනාව ලෙස රු.1,850,000 ක් සභා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.	2022 වර්ෂයේ නිකුත් කරන ලද පීඑස්/සීඑස්ඒ/11-18(1) හා පීඑස්/සීඑස්ඒ/11-18(11) චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(iv)	දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට පෙට්‍රල් වාහනයක්නම් මසකට ලීටර් 600 ක්ද ඩීසල් වාහනයක්නම් මසකට ලීටර් 500 ක්ද ලබා දිය හැකි බව දන්වා තිබියදී එකී විධිවිධාන අභිබවායමින් මසකට ඩීසල් ලීටර් 600 ක් බැගින් ලබා දීම නිසා 2019 ජූලි මස සිට 2022 සැප්තැම්බර් මස දක්වා 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන චක්‍රලේඛයේ 4.1 හි උපදෙස්වලට අනුකූල නොවන ලෙස ඩීසල් ලීටර් 3900 ක් වෙනුවෙන් රු.708,000ක්ද සුපිරි ඩීසල් රේටයන් පදනම් කරගෙන ගෙවීම් කිරීම නිසා රු.682,525ක වැඩිපුර ගෙවීමක්ද සිදුකර තිබුණි.	දැනට සභාපතිවරයාට ලබාදී ඇති වාහනයට හැර සභා ලේකම් කාර්යාලයේ සංචිත හා වෙන්කරන ලද වාහනවලට 2023 අප්‍රේල් 01 දින සිට සාමාන්‍ය ඩීසල්/පෙට්‍රල් රේටය පදනම් කරගෙන ඉන්ධන දීමනාව ගෙවන බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(v)	2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන චක්‍රලේඛයේ 4.2 ඡේදයට පටහැනිව දකුණු පළාත් සභාවේ සභාපතිවරයාගේ සම්බන්ධීකරණ හා මහජන සම්බන්ධතා ලේකම්වරුන්ට 2019 ඔක්තෝබර් මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා මසකට රු.50,000 බැගින් රු.3,700,000 ක් වූ වාහන දීමනාවක් සහ නිල වාහන සපයා නොතිබියදීත් 2019 අගෝස්තු සිට 2022 ඔක්තෝබර් දක්වා රු.2,516,680 ක් වූ ඉන්ධන දීමනාවක් සහා ලේකම් කාර්යාලයෙන් ගෙවා තිබුණි.	ජනාධිපති ලේකම්ගේ පීඑස්/සීඑස්ඒ/11-18 රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 4.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා සභාපතිවරුන්ගේ සහාය කාර්ය මණ්ඩලයේ නිල වාහන වෙනුවෙන් චක්‍රලේඛ සීමාවන්ට යටත්ව මාසයේ පළමු දින දේශීය වෙළඳපොලේ පවතින ඉන්ධනවල වටිනාකමට සමාන මුදලක් ඉන්ධන දීමනාවක් වශයෙන් ගෙවීමට කටයුතු කර ඇති බව	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.3 ශිර්ෂය 302 - දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති 41	යොමුගත කාර්ය පරිපාටික රීතිය ප්‍රකාරව දකුණු පළාතට අදාළව අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවන් 10 ක් පිළිබඳ තොරතුරු ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරවර නියෝග සඳහා යොමු කර ඇති අතර අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව.	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අනුව කටයුතු කල යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2023 නොවැම්බර් 18 දින පැවැති දකුණු පළාත් සභා පාසල්වල විෂයයන් 56කට අදාළව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු 3230 ක් සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පංතියේ 1(අ) ශ්‍රේණියට බඳවාගැනීමේ තරඟ විභාගයේ ප්‍රශ්න පත්‍ර සැකසීමේ හා ඇගයීමේ කටයුතු වලින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන් ඉවත් කර දකුණු පළාත් සභාවේ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නිලධාරීන්	සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ වන බැවින් පිළිතුරු පත්‍ර ඇගයීමට ඔවුන් සම්බන්ධ කර නොගැනීමට තීරණය කළ බව.	බඳවාගැනීමේ නිවේදනයට අනුව කටයුතු කල යුතුය.

සම්බන්ධ කරගෙන තිබුණි. ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවාගැනීම පිළිබඳ නිවේදනය කිරීමේදී හඳුනාගෙන තිබූ පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා පත්වීම් ලබාදී තිබීම, පුරප්පාඩු පැවති බවට හඳුනාගෙන තිබූ ඇතැම් පාසල්වල පුරප්පාඩු පූරණයවී නොතිබීම, විභාගය සමත් ලේඛනයේ නම සඳහන් නොවූ උපාධිධාරීන් වෙත පත්වීම් ලබාදී තිබීම, ලකුණු ලබාගෙන තිබූ අනුපිළිවෙල අනුව අයදුම්කරුගේ තේරීම මත බඳවාගැනීම් සිදු කර නොතිබීම හා ගැසට් නිවේදනයේ සඳහන් විෂය සුදුසුකම් නොතිබූ අයදුම්කරුවන් 12 දෙනෙකු හට පත්වීම් ලබා දී තිබීම යනාදී කරුණු නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) මතභේදයට තුඩු දුන් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023 හා 2024 වර්ෂයන්හි පවත්වා තිබූ දකුණු පළාත් විවිධ තනතුරුවලට බඳවාගැනීමේ තරඟ විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාගයන්ට අදාළව ප්‍රශ්න පත්‍ර සැකසීම් හා ඇගයීම් වෙනුවෙන් සම්පත්දායකයින් වෙත පිළිවෙලින් රු.3,937,881ක් හා රු.1,314,332ක් ගෙවීම් කර තිබූ අතර එම තරඟ විභාගයන්හි ප්‍රශ්න පත්‍ර සැකසීම හා ඇගයීම්වලට අදාළ සම්පත්දායක සංචිතය කොමිෂන් සභාවේ විභාග අංශයේ අනු දැනුම මත පමණක් පවතින රහස්‍යතා ලේඛනයක් බැවින් විගණන නිලධාරීන්ද ඇතුළුව බාහිර පාර්ශවයන්ට එම තොරතුරු ලබා නොදීමට කටයුතු කිරීම මත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විගණකාධිපතිවරයාගේ විෂය පථය සීමා කිරීමට හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයාට ලැබීතිබූ තොරතුරු ලබා ගැනීමේ හිමිකම අහිමි කරන ආකාරයෙන් කටයුතු කර තිබුණි. එසේම	2024 ජුනි 26 දිනැති කොමිෂන් සභා තීරණයද නැවතත් කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන ලද අතර සම්පත්දායක සංචිතය විගණනය වෙත ලබාදිය හැකි බවට 2025 පෙබරවාරි 05 දින පැවති කොමිෂන් සභාවේ දී තීරණය කර ඇති බව.	විගණන කටයුතු වලට අවශ්‍ය තොරතුරු නිසි පරිදි ලබා දීමේ වගකීම ඉටුකල යුතුය.

දකුණු පළාත් විවිධ තනතුරුවලට බඳවාගැනීම් තරඟ විභාග හා කාර්යක්ෂමතා කඩඉම් විභාගයන්ට අදාළව ප්‍රශ්න පත්‍ර සැකසීම් හා ඇගයීම් වෙනුවෙන් සම්පත්දායකයින් තෝරාගැනීම පිළිබඳ විධිමත් විගණන පරීක්ෂණයක් පැවැත්වීමට නොහැකි වීම නිසා විභාග පැවැත්වීම සම්බන්ධයෙන් සිදු වී තිබූ අඩුපාඩු, පවතින ගැටළු සහ එම කටයුතුවල ස්වාධිනත්වය හා විනිවිදභාවය ඇතුළු ඒ සම්බන්ධ ක්‍රියාවලියේ පවතින ගැටළු අධ්‍යයනය කිරීමට විගණනයේදී නොහැකි විය.

(ඈ) අවිධිමත් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ප්‍රධාන නිත්‍ය කාර්යභාරයන් ඉටු කිරීමේදී විධිමත් අනුමැතිය මත නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා ලබා ගැනීමට හැකියාව තිබියදී, කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගයන්හි අයදුම්පත්‍ර සහිත කවර විවෘත කිරිම, පරීක්ෂා කිරීම, පරිගණකගත කිරීම හා නාම ලේඛන සැකසීම, ප්‍රවේශ පත්‍ර සැකසීම හා තැපැල් කිරීම ආදී කාර්යයන් ඉටු කිරීමට කාර්ය මණ්ඩලයට දිරි දීමනාවක් අනුමත කරවාගෙන දකුණු පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගයට සම්බන්ධ කාර්යමණ්ඩලය වෙත එකතුව රු.337,636ක දිරි දීමනාවක් ගෙවා තිබූ අතරම උක්ත විභාගයෙහි රාජකාරී කටයුතු කඩිනමින් ඉටු කිරීම වෙනුවෙන් එම නිලධාරීන් වෙත රු.80,150ක නිවාඩු දින වැටුප්ද රු.273,838ක අතිකාල දීමනාද ලෙස දෙයාකාරයක දීමනා ගෙවා තිබුණි.	කැලි පදනම මත යම් නිශ්චිත ප්‍රමාණයකට අමතරව සිදුකරන ලද රාජකාරින්ට පමණක් ඊට සම්බන්ධ වූ කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීමට ආණ්ඩුකාර අනුමැතිය ලැබී ඇති බව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලයට දිරිදීමනාවක් ආණ්ඩුකාරවර මඟින් අනුමත කරවාගෙන ගෙවා ඇති බව .	විධිමත් අනුමැතියක් යටතේ ගෙවීම් සිදු කල යුතුය.

1.5.4 ශීර්ෂය 304 - දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) දක්ෂණපාය සංකීර්ණයෙහි අමාත්‍යාංශ ඇතුළු ආයතනයන්හි පරිගණක ජාලගත කිරීම වෙනුවෙන් 2014 වර්ෂයේදී රු.5,380,634ක මුදලක් වැයකර තිබූ අතර 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වාර්ෂික සේවා කිරීම් හා නඩත්තු කිරීම් වෙනුවෙන් රු.11,401,133ක්ද අන්තර්ජාල සේවා සැපයීම වෙනුවෙන් රු.13,792,564ක්ද හා Firewall පද්ධතිය මිලදී ගැනීම හා වාර්ෂික බලපත්‍ර ලබාගැනීම වෙනුවෙන් රු.9,041,122ක මුදලක්ද ප්‍රධාන අමාත්‍යාංශය විසින් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි.		
(ඒ) දක්ෂිණපාය පරිගණක ජාල පද්ධතියේ නඩත්තු සම්බන්ධයෙන් පරිගණක වැඩසටහන් සම්පාදකයින්ගේ අධීක්ෂණය හා දකුණු පළාත් සභා පරිගණක ජාලය සම්බන්ධ අධීක්ෂණය හා පාලනය සඳහා පත්කර තිබූ උපදේශකවරයාගේ නිර්දේශ ලබා ගැනීමකින් තොරව ලිපි කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර්ජාල සේවාවේ ධාරිතාවය 20MBPS සිට 40MBPS ක් දක්වා වැඩිකර ගැනීම සඳහා 2021 ඔක්තෝබර් 29 දින ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් ඉල්ලීම්කර තිබුණ අතර, ප්‍රධාන ලේකම් විසින් ඒ සඳහා 2021 නොවැම්බර් 11 දිනැති ලිපිය මගින් ඉදිරි අවශ්‍යතාවය මත එම ධාරිතාවය අඩු හෝ වැඩි කර ගැනීමට අවශ්‍ය බලය ප්‍රධාන	පද්ධතීන්හි ඇතිවන ගැටළු තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන් වෙත වාර්තා වීමෙන් පසු අවශ්‍ය විසඳුම් ලබා දෙන අතර විසඳා ගත නොහැකි ගැටළු ප්‍රධාන අමාත්‍යාංශයෙහි තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන් හා පරිගණක වැඩසටහන් සම්පාදක වෙතද එසේත් නොමැති නම් සේවා සපයන ආයතන වෙතද යොමුකර විසඳීම සිදු කරන අතර අන්තර්ජාල සේවාවේ වේගය නිරීක්ෂණය සඳහා පැය 24 ක්‍රියාත්මක මාර්ගගත පිවිසුමක් පවතින බව.	අධීක්ෂණය හා පාලනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාගෙන පද්ධතියේ අවශ්‍ය ධාරිතාවය තීරණය කර පද්ධතිය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.

	අමාත්‍යාංශ ලේකම් වෙත පවරා ඒ සඳහා අනුමැතිය ලබාදී තිබුණද, ඒ අනුව කටයුතු කිරීමකින් තොරව 2021 දෙසැම්බර් මස සිට 2024 ජුනි දක්වා මාසිකව ධාරිතාවය 20 MBPS ක් බැගින් ධාරිතාවය 420MBPS ක් සඳහා රු.3,104,535ක මුදලක් අනවශ්‍ය පරිදි ප්‍රධාන අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි.		
	(බි) පරිගණක ජාල අධීක්ෂණය හා පාලනය සම්බන්ධ නියාමන කටයුතු සඳහා තාවකාලිකව උපදේශකවරයෙකු පත් කරන ලද නමුත් ඉහත ගෙවීම් සිදු කිරීමේදී මෙම පරිගණක ජාල පද්ධතියේ වර්තමාන පැවැත්ම, කාලීනභාවය සම්බන්ධයෙන් උපදේශකවරයාගෙන් වාර්තාවක් හෝ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පරිගණක ජාල පද්ධතිය ස්ථාපිත කරන තෙක් අදාළ උපදේශකවරයාගේ සේවාව ලබා ගත් අතර අදාළ සේවා සැපයීම් සිදු කරන කාලය තුළදී එම පද්ධතිය සඳහා උපදේශකත්වය සැපයීමක් සිදු නොවූ බව.	ගෙවීම් සිදු කිරීමේදී පද්ධතියේ වර්තමාන පැවැත්ම, කාලීනභාවය සම්බන්ධයෙන් උපදේශකවරයාගෙන් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කල යුතුය.
(ii)	අකුරැස්ස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පිහිටි ඉඩම හා පරදූව ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානය පිහිටි ඉඩම අත්පත් කර ගැනීම සඳහා දකුණු පළාත් ප්‍රධාන තක්සේරුකරු ගෙන් 2018 වර්ෂයේදී තක්සේරු වාර්තා ලබා ගෙන වසර 07 කට අධික කාලයක් ගත කර තිබුණද, එකී ඉඩම් පවරාගෙන නොතිබීම නිසා 2023 වර්ෂයේදී උක්ත ඉඩම් වෙනුවෙන් ලබා ගත් නව තක්සේරු වටිනාකම රු.6,275,000කින් වැඩි වී තිබුණි.	මෙම ඉඩම අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේ ලිපි ලේඛන හුවමාරුවෙහි ප්‍රමාදයන් සිදු වූ බව හා ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අදාළ නිලධාරින් දැනුවත් කිරීමට පියවර ගන්නා බව.	ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කල යුතුය.
(iii)	රස ගුණ පිරි හෙළිදිව ඔසු ව්‍යාපෘතිය යටතේ දේශීය ආහාර වර්ග හා ඖෂධ වර්ග දකුණු පළාතේ ජනතාව අතර ප්‍රචලිත කර ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීම සඳහාත් රාජ්‍ය ප්‍රතිපත්ති අනුව යමින් දිවිනැගුම වැඩපිළිවෙල යටතේ අඩු ආදායම් පවුල් ඒකක කිහිපයක ආදායම් ප්‍රවර්ධනය කිරීමත් අරමුණු කරගනිමින් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2013 හා	ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති අංශය වෙත යොමු කර ඇති අතර අයවිය යුතු මුදල් අයකර ගැනීමට අදාළ නීති අංශයේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව.	අයකර ගැනීම් කටයුතු කඩිනමින් අවසන් කල යුතුය.

2015 වර්ෂයන්හිදී තෝරාගත් ප්‍රතිලාභීන් වෙත ලබාදී තිබූ ට්‍රයිසිකල් ට්‍රක් රථ 05ක් හා එක් ත්‍රිරෝද රථයක් වෙනුවෙන් අයවිය යුතුව තිබූ රු.716,000ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක්ම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ගාල්ල අධිවේගී බස්නැවතුම්පලේ අව්වැසි ආවරණය ඉදිකිරීමට අදාළ ටෙන්ඩරයේදී වහල කොටසට යෙදිය යුතු 22mm පොලිකාබනේට් ශීට් වෙළඳපොලේ නොමැති බැවින් ඊට වඩා අඩු ඝනකමින් යුතු පොලිකාබනේට් ශීට් යොදවන බවට සඳහන් කර ඇති අවම ලංසුකරුට කොන්ත්‍රාත්තුව ලබා නොදීම නිසා රු.373,992 ක පාඩුවක් සිදු වී තිබුණ අතර අව්වැසි ආවරණයේ පිටුපස හා පැති කොටසට ඇස්තමේන්තුවේ සඳහන් 10mm ඝනකමැති පොලිකාබනේට් ශීට් වෙනුවට 4mm ඝනකමැති පොලිකාබනේට් ශීට් යොදා තිබීම ඇතුළුව වැඩ විෂයන් 11 ක් වෙනුවෙන් රු.699,840 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණ අතර තවද, ඝනකම වූ 22mm පොලිකාබනේට් ශීට් යොදා තිබුණු බවට තහවුරු කර ගැනීමකින් තොරව ඊට අදාළ ඇස්තමේන්තුගත මුදල වූ රු.1,305,120 ක්ද ගෙවීම් කර තිබුණි.	10mm පොලිකාබනේට් ශීට් යෙදීමේදී අධික වියදමක් දැරිය යුතු බැවින් සහ 4mm පොලිකාබනේට් ශීට් යෙදීම සුදුසු බැවින් නාගරික සංවර්ධන අධිකාරියේ වාස්තු විද්‍යාඥ සමඟ සාකච්ඡා කර ඇස්තමේන්තුව කඩිනමින් ලබා දිය යුතු බැවින් මිළ ගණන් ගෙන විශේෂ මිළ විශ්ලේෂණයක් සකස් කිරීමට කාලය ප්‍රමාණවත් නොවුන බැවින් Provisional Sum යොදා ඇස්තමේන්තුව සකස් කල බව හා කොන්ත්‍රාත්කරු විසින් ඊට අදාළ ද්‍රව්‍ය මිළ දී ගත් බිල්පත් අනුව වෙළඳපොලේ පවතින මිලද සලකා මිළ බිඳ වැටුම පරීක්ෂා කර බිල්පතට ඇතුළත් කර ඇති බව.	ප්‍රමිතිය තහවුරු කර ගෙන ගෙවීම් සිදු කල යුතුය.
(ii)	දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.25,458,409 ක මුදලක් වැයකර 2019 අප්‍රේල් 22 දින වැඩනිම කර තිබූ යශෝරාපුර තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීමේදී ප්‍රමිතිගත නොවන අමුද්‍රව්‍ය භාවිතා	ඉඩමෙහි අයිතිය දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයට පැවරීමෙන් අනතුරුව ඵලදායී කාර්යයන්ට යොදා ගැනීමට අදාළ ක්‍රියාමාර්ගයන් ගන්නා බව.	උපයෝජිත වත්කමක් බවට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.

කර තිබූ නමුත් ප්‍රමිතිගත අමුද්‍රව්‍ය මිල රේටයන්ටම ගෙවීම් කර තිබීම නිසා රු.6,302,940ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණ අතර එම ඉදිකිරීම ඌන උපයෝජිතව පැවතීම නිසා ඒ සඳහා දරන ලද මුලු මුදලම නිෂ්කාර්ය වී තිබුණි.

1.5.4.1 දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

(අ) ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර බස් නැවතුම්පල ඉදිකිරීමේ වටිනාකම රු.20,778,835ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.1,200,000 ක් ලෙස දක්වා තිබීමෙන් ගොඩනැගිලි වටිනාකම රු.19,578,835කින් අඩුවෙන් දක්වා තිබුණි.	පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව සටහන් කර ඇති බව හා නැවත පළාත් ආදායම් කොමසාරිස් විමසා ඉදිරි කටයුතු කරන බව.	වත්කම්වල නිවැරදි අගය ගිණුම්ගත කල යුතුය.
(ii)	රු.13,200,000ක් වටිනාකමැති හබරාදූව බස් නැවතුම්පල ඉඩම සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 08 දින දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත පවරා තිබුණද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි.	ඉඩමේ අයිතිය ප්‍රධාන අමාත්‍යාංශයට පැවරුවද පරිහරණය කිරීම අධිකාරිය විසින් සිදුකරනු ලබන හෙයින් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් නොකළ බව හා ඒ පිළිබඳ ප්‍රධාන අමාත්‍යාංශය විමසා ඉදිරි කටයුතු සිදු කරන බව.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.
(iii)	ගාල්ල බස් නැවතුම්පලෙහි සවිකර තිබූ සූර්යපැනල පද්ධති 02ක වටිනාකම රු.3,200,000ක් වුවද රු.1,600,000ක් ලෙස සටහන් කර තිබීමෙන් ජංගම නොවන වත්කම් රු.1,600,000කින් අඩුවෙන් දක්වා තිබූ අතර ක්ෂය වියදම්ද අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.	ගාල්ල බස්නැවතුම්පොළෙහි මීටර් 01 හා 02 යටතේ කිලෝවොට් 08 බැගින් සූර්ය පැනල පද්ධති 02ක් යටතේ කිලෝවොට් 16ක් සවි කර ඇති බව හා එහි වටිනාකම රු.1,600,000ක් බව.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.
(iv)	රු.7,590,000ක වටිනාකමැති ත්‍රීරෝද රථ, පාසල් සේවා හා කාර්යාල සේවා නියාමන මෘදුකාංගය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් ගෙවා නොතිබුණු රු.1,518,000ක වටිනාකම ජංගම වගකීමක් ලෙස සටහන් කර නොතිබුණි.	මෙවැනි දෝෂ මඟහරවා ගැනීම සඳහා ගිණුම් කටයුතු සම්බන්ධ ආයතනයේ නිලධාරීන් පුහුණු කිරීම් සිදුකර ඉදිරියේදී මෙවැනි වැරදි නොවීමට කටයුතු කරන බව.	ජංගම වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.

(ආ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය රීති 131.3	යොමුගත රීතියට අනුකූල නොවන පරිදි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සහතික කිරීමේ නිලධාරියා වශයෙන් අධ්‍යක්ෂ (මූල්‍ය) විසින් මූල්‍ය බලතල ඉක්මවූ වටිනාකම් සහිත වවුචර්පත් 115ක එකතුව රු.8,311,139ක වටිනාකම් සඳහා වියදම් සහතික කර තිබුණි.	මුද්‍රණ දෝෂයක් හේතුවෙන් එසේ සිදුවී ඇති බව හා ඒ සඳහා නිසි පරිදි ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් බලය පැවරී ඇති බව.	මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ඇ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
GPS තාක්ෂණය බස් සේවා කළමනාකරණය සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘති වාර්තාව අනුව, සෑම ගමන් වාරයකම අවම වශයෙන් විනාඩි 05 ක් බැගින්, දිනකට ගමන් වාර 13,000 ක් ප්‍රමාද වීමෙන් වසරකදී, දකුණු පළාතට විනාඩි 3,250,000 ක් අහිමි වන බව දක්වා තිබුණි. ඒ අනුව, එම ප්‍රමාද වන එක් ගමන් වාරයක් සඳහා, 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය ප්‍රකාරව දඩ මුදලක් අයකළේ නම්, අවම වශයෙන් වර්ෂයකට රු.මිලියන 949 ක දඩ මුදලක් අය කර ගත හැකිව තිබුණද, ප්‍රමාද ගාස්තු ලෙස රු.3,343,893ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අය කර ගෙන තිබුණි.	සියළුම ගමන්වාර ප්‍රමාද කිරීම සඳහා දඩ අය කිරීම ප්‍රායෝගිකව අපහසු බව හා තාක්ෂණය යොදා ගෙන ගමන්වාර ප්‍රමාද වැළක්වීමට කටයුතු කිරීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරන බව.	1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය ප්‍රකාරව දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතුය.

(ඈ) අවිධිමත් ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ත්‍රීවීල් රථ 70000ක්, පාසල් බස් රථ 1500ක් සහ කාර්යාල ප්‍රවාහන සේවා රථ 400ක් ලියාපදිංචිය අපේක්ෂාවෙන් ලබාගෙන තිබූ වෙබ් යෙදවුම ප්‍රසම්පාදනයට අදාළව ප්‍රසම්පාදන තීරණය පරිදි වසර 05ක වගකීම් සහතිකයක් ලබා නොගෙන වසර 05ක පලපුරුද්ද සහිත ආයතනයක් ලෙස හුවා දක්වමින්, කොන්ත්‍රාත්තුව පිරිනැමීමට මාස 06කට පෙර ලියාපදිංචි වූ ආයතනයකට වසර 05ක් පුරා ගෙවිය යුතු රු.7,590,000ක මුදලින් සියයට 80ක් පළමුවද ගෙවා තිබූ අතර මෙම වෙබ් යෙදවුමෙන් වසර 1 ½ ක් තුල ත්‍රීවීල් රථ 1712ක් එනම් සියයට 3ක කාර්යසාධනයක් පමණක් ළඟා කර තිබියදීත් නව සභාපති විසින් පසුදාතම යොදා ඇති කරගත් වසර පහක සේවා ගිවිසුමක්ද සහිතව අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහළ කාර්යසාධනයක් පවතින බවට සඳහන් කරමින් ඉතිරි සියයට 20ක වාරික මුදල වන රු.1,518,000ක්ද ගෙවා තිබුණි. එසේම පලපුරුද්දක් නොමැති ආයතනයකට සියයට 97ක කාර්යසාධනයක් ලබා නොගෙන තිබියදී මුළු මුදලම මුදා හැරීම මගින් මුල්‍ය රීති 84 - 87න් බැහැරව කටයුතු කර තිබුණි.	මේ මෘදුකාංගය සකස් කිරීමේදී ත්‍රීරෝද රථ, පාසල් බස්රථ, කාර්යාල බස්රථ ආදී සියල්ලටම අදාලව සකස් කර ඇති අතර වෙනත් උපායමාර්ගයන්ට යොමු කරමින් ඉදිරි කාලයේදී අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරන බව හා 2025 පෙබරවාරි 27 දින අත්සන් කරන ලද ගිවිසුම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර ඉදිරි කටයුතු කරන බව.	මුල්‍ය රීති හා ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව කටයුතු කල යුතුය.
(ii)	දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් තවලම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට අවශ්‍ය ඒ.බී.සී. මිශ්‍ර ගල් ඝන මීටර 50 ක් මිලදී ගැනීමේදී, ඒ.බී.සී. මිශ්‍ර ගල් තොගයේ ප්‍රමිතිය තහවුරු කර ගැනීමකින් තොරව මිලදී ගෙන තිබූ අතර භෞතිකව සාම්පල් සම්බන්ධයෙන් සිදු කල පරීක්ෂණයේ වාර්තා අනුව අදාළ ඒ.බී.සී. මිශ්‍ර ගල් නියමිත ප්‍රමිතිය නොමැති බවට තහවුරු වූ අතර, ඝන මීටර 23.04 ක් සෘජුවම අදාළ මාර්ග වැඩබිමට ප්‍රවාහනය කර තිබුණු බවත්, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල පරිශ්‍රයට ගෙනවිත් තිබුණු තොගයේ මුට්ට ප්‍රමාණය හා වටිනාකම තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණු බවත් අමුද්‍රව්‍ය තොග මිලදී ගැනීමේ හා තොග ලේඛණ නඩත්තු කිරීමේ පාලන පද්ධතිය දුර්වල මට්ටමක පැවති බවත් වැඩබලන	2025 වර්ෂයේ සිට වගකීම් කාලය සහිත උපාංග නිවැරදි හඳුනා ගෙන ඒ අනුව කටයුතු කිරීමටත් අනෙකුත් උපාංග මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා වාර්ෂිකව ගිවිසුම් ගතවීමටත් වසරකට වරක් එය සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරන බව.	නියමිත ප්‍රමිතියෙන් යුතු ද්‍රව්‍ය මිලදී ගත යුතුය.

	ඉංජිනේරු විසින් නිසි කාර්ය පරිපාටියෙන් බැහැරව ඒ.බී.සී. මිශ්‍ර ගල් තොගයෙන් කොටසක් වැඩ බිමටත් අනෙක් කොටස ගබඩා පරිශ්‍රයටත් ගෙනවිත් තිබීමත් ඒ අනුව ඒ.බී.සී. මිශ්‍ර ගල් සැපයීම සඳහා වැය කර තිබුණු රු.262,500 ක මුදල නිෂ්කාර්ය ගෙවීමක් බවත් නිරීක්ෂණය විය.		
(iii)	දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන කුඩාමලාන ගම්මානයට යන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 07ක් වූ දළ ඇස්තමේන්තුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කිරීම වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අභිබවා අදාළ කර්මාන්තය කොටස් 02 කට බෙදා එම මාර්ගයේ පළමු කිලෝමීටරය රු.4,234,209කට ග්‍රාම සංවර්ධන සමිතියක් සහ දෙවන කිලෝමීටරය රු.2,884,540කට ගොවි සංවිධානයක් සමඟ 2024 ජුලි 10 දින ගිවිසුම් ගතවී අදාළ කොන්ත්‍රාත්තුව අවසන් වූ පසු පළමු කිලෝමීටරය සඳහා අදාළ සමිතිය වෙත රු.4,206,372ක්ද දෙවන කිලෝමීටරය සඳහා අදාළ ගොවි සංවිධානය වෙත රු.3,019,123ක්ද වශයෙන් එකතු වටිනාකම රු.7,225,495ක් ගෙවීම් කිරීම නිසා, තරඟකාරි මිල ගණන් කැඳවා පූර්ණ සුදුසුකම් සහිත කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන අවම මිලකට අදාළ කොන්ත්‍රාත්තුව සිදු කර ගැනීමට තිබූ අවකාශය මගහැරී තිබුණි.	මෙම කර්මාන්ත දෙක කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය වූ බැවින්, අධිකාරිය විසින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021 ට අනුකූලව මෙම කර්මාන්ත 02 සමිති 02 ක් මගින් ඉටුකර ගෙන ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.4.2 දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

(අ) නොවිසඳී ඇති විගණන ඡේද

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ තේපැල ලක්ෂ 25ක් සැපයීම සම්බන්ධයෙන් රජයට සෘජුවම සිදුවී ඇති රු.8,525,291ක අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	තවදුරටත් රු. 8,525,291ක් තේ පැල සැපයුම්කරුගෙන් අයවිය යුතුව පවතින බව.	අයකර ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කල යුතුය.

1.5.4.3 රුහුණු සංචාරක කාර්යාංශය

(අ) ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශුද්ධ වත්කම් එකතුව රු.243,939,578 ක් හා හිමිකම් වල වටිනාකම රු.248,563,578 ක් වීමෙන් ශුද්ධ වත්කම් හා හිමිකම් අතර රු.4,624,000 ක වෙනසක් නිරීක්ෂණය විය.	2025 මූල්‍ය ප්‍රකාශයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදි වටිනාකම් ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය.
(ii)	කාර්යාංශයේ සංචිත වාහනයක් ලෙස භාවිතා කරන පෙජරෝ රථයේ ප්‍රාග්ධන ස්වරූපයේ අළුත්වැඩියා සඳහා දරන ලද රු.1,925,690ක වියදම වර්ෂයේ වියදමක් ලෙස කපාහැර තිබුණි.	වාහන ප්‍රත්‍යාගණනයේදී මෙම මුදලද අදාල කර ගනිමින් ප්‍රත්‍යාගණනය සිදුකර 2025 මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කිරීමට කටයුතු කරන බව.	නිවැරදි වටිනාකම් ගිණුම්ගත කල යුතුය.
(iii)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂය තුල මුදල් වල ශුද්ධ වෙනස්වීම රු.5,265,705 ක් වුවත් රු.116,663,831 ක සෘණ ශේෂයක් ලෙස දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශනයෙන් මෙම ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වටිනාකම් නිවැරදිව සටහන් කල යුතුය.

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා රුහුණු සංචාරක කාර්යාංශය අතර 2023 ඔක්තෝබර් මස 23 දින අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම අනුව ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු වූයේ වැවිලි බෝග සහ කෘෂි අපනයන බෝග ප්‍රවර්ධනය කිරීම වුවත්, එම අරමුණට පටහැනිව සංචාරක උද්‍යානයක් ඇතිකර පවත්වාගෙන ගොස් තිබුණි. එසේම එම උද්‍යානයේ කඩකාමර බදු දීමට අදාළව ඇතිකර ගෙන තිබූ බදු ගිවිසුම ප්‍රකාරව කඩ කාමර කුලිය අයවීම ප්‍රමාද වීම මත අමතරව සියයට 10ක දඩ මුදලද කාර්යාංශය විසින් අයකර නොතිබුණි.	2025 ජනවාරි මස සිට බදු මුදල් නියමිත දිනට නොගෙවන්නේ නම් සියයට 10ක දඩ මුදල අය කිරීමට කටයුතු කරන බව.	කඩකාමර කුලී හා දඩමුදල් නියමිත දිනට අයකර ගැනීමට කටයුතු කල යුතුය.

(ii)	උද්‍යානය තුළ ජලාශයේ බෝට්ටු සවාරි ආදායමින් සියයට 30 ක මුදලක් රුහුණු සංචාරක කාර්යාංශය වෙත දෛනිකව ගෙවීම් කල යුතු අතර ඒ අනුව කාර්යාංශය විසින් ආදායම් රැස්කර තිබුණද බෝට්ටු සවාරිය සඳහාම ටිකට්පත් නිකුත් කිරීම පිළිබඳ අභ්‍යන්තර පරීක්ෂාවක් කාර්යාංශය විසින් සිදු නොකිරීම මත ආදායම ක්‍රමයෙන් අඩුවී තිබුණි. තවද මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ ATM යන්ත්‍ර සඳහා කුටි 02 ක් සවිකර තිබුණද අදාළ බැංකු සමඟ බදු ගිවිසුම් අත්සන් කර ඊට අදාළ ආදායම් රැස්කර ගැනීමට කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක්ම කටයුතු කර නොතිබුණි. ඉදිකර තිබූ තාවකාලික ගොඩනැගිල්ලේ වෙළඳාම සඳහා කොටස් 25 ක් දෛනිකව ආදායම රැස් කිරීමේ පදනමින් වෙළඳුන් වෙත ලබාදී තිබුණු නමුත් වැසි දිනවලදී දෛනික බදු මුදල අය කිරීමකින් තොරව සිටි අවස්ථාද පැවතුණි.	බදු මුදල් තීරණය කිරීම සඳහා මිල කමිටුවක් පත් කර ඇති බව.	ආදායම් උපයනු ලබන සෑම ක්ෂේත්‍රයකින්ම ක්‍රමවත් පරිදි ආදායම් රැස්කිරීමට කටයුතු කල යුතුය.
(iii)	රුහුණු සංචාරක කාර්යාංශයට අයත් අම්බලන්ගොඩ පහසුකම් සේවා මධ්‍යස්ථානය 2023 වර්ෂයේ සිට වර්ෂ 02 ක කාලයක් සඳහා මසකට රු.48,000 බැගින් බදු පදනම මත ලබාදී තිබූ අතර බදුකරු විසින් එම වසරේ සිටම වර්ෂ 05 ක කාලයක් සඳහා රු.50,000 බැගින් වූ මාසික බදු මුදලකට අතුරු බදු දී තිබුණි. කාර්යාංශය විසින් බදුකරු සමඟ ගිවිසුම්ගත වන අවස්ථාවේදී අතුරු බදු ලබාදීම සම්බන්ධයෙන් කොන්දේසි පනවා නොතිබීම නිසා අතුරු බදුකරු විසින් බදු මුදල් ගෙවීම පැහැර හැර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට බදු මුදල ලෙස රු.576,000ක්ද ජල හා විදුලි බිල්පත් ලෙස රු.262,862ක්ද අයවිය යුතුව පැවතුණි.	අයවිය යුතු හිඟ බදු මුදල සහ ජල විදුලි බිල්පත් ගාස්තු අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මූලික පියවර ගෙන ඇති බව.	නිසි ආකාරව සියලු කරුණු ඇතුළත් කර බදු ගිවිසුම්ගත විය යුතු යුතු අතර අයකල යුතු බදු මුදල් නියමිත දිනට අයකල යුතුය.

(iv)	රුහුණු සංචාරක කාර්යාංශයට අයත් මදුනාගල උණුදිය උල්පත් පරිශ්‍රය තුළ ඉදිකර තිබූ කඩ කාමර 24 බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් රු.294,000ක බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. තවද, දැල්කඩ 10 සඳහා වූ බදු ගිවිසුම් කාලසීමාව අවසන් වූ පසු නව බදු ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කිරීමකින් තොරව පැරණි බදු ගිවිසුමේ සඳහන් මුදලම අය කරමින් පැවති අතර එක් දැල්කඩයකින් රු.31,000ක් හා දැල්කඩ 02කින් 2023 හා 2024 වර්ෂයේදී කිසිදු බදු මුදලක්ද අකුරළ පොදු සනීපාරක්ෂක මධ්‍යස්ථානය 2023 ජුනි මාසයේ සිට බදු දී නොතිබීම නිසා රු.307,800ක ආදායමක්ද අයකර නොතිබුණි.	මෙම කඩ 2025 සංවර්ධන සැලැස්මේ ප්‍රතිපාදන මඟින් ඉදිරියේදී ස්ථිරව සකස් කිරීමෙන් පසු නියමිත ටෙන්ඩර් පටිපාටියකට අනුව වෙළඳසැල් ලබා දීමට හා හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ බදු අයකර ගැනීමටත් බදු ගිවිසුම් අත්සන් කිරීමටත් කටයුතු කර ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(v)	රුහුණු සංචාරක කාර්යාංශයට අයත් කිරිහලෙන් සහ තාවකාලික බක්කියෙන් 2024 වර්ෂයේදී කිසිඳු බදු ආදායමක් ලැබී නොතිබුණු අතර හැකියාව ඇති පුද්ගලයකු වෙත බදුදීමට හෝ කටයුතු කර නොතිබුණි. රථගාල තුළ පවතින ආපනශාලාව, මදුනාගල උණුදිය උල්පත් පරිශ්‍රය තුළ පැවති ඡායාරූප ගන්නා මධ්‍යස්ථානය සහ එම පරිශ්‍රයට අයත් අක්කර 05 රූඩ් 01 පර්.13 ක ප්‍රමාණයෙන් යුතු කුඹුරු ඉඩමෙහි බදු ගිවිසුමේ කාලය අවසන් වී තිබුණද බදු ගිවිසුම අළුත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් කාර්යාංශයට අයවිය යුතු ආදායම අහිමිවී තිබුණි.	ඉදිරියේදී ගැණුම්කරු සමඟ ගිවිසුම්ගත වී අදාළ බදු මුදල් අයකර ගැනිමට කටයුතු කරන බව.	බදු ගිවිසුම් යාවත්කාලීන කර බදු මුදල් අයකිරීමට කටයුතු කල යුතුය.

(ඇ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
රුහුණු සංචාරක කාර්යාංශයට අයත් මදුනාගල උණුදිය උල්පත් පරිශ්‍රයේ පැවති සංචාරක බංගලාව 2006	මදුනාගල උණුදිය උල්පත් පරිශ්‍රයේ පවතින සංචාරක බංගලා අලුත්වැඩියාව සඳහා 2025	නියමිත කාලයට අලුත්වැඩියාවන් සිදුකර උපරිම ඵලදායීතාවයක් ලැබෙන අයුරින් භාවිතා කල

	වර්ෂයේදී පමණ ඉදිකර තිබුණද මෑත කාලයේදී සැලකිය යුතු අළුත්වැඩියාවක් සිදුනොකිරීම නිසා විගණිත අවස්ථාව වන විට සංචාරකයින් සඳහා නවාතැන් පහසුකම් ලබාදිය නොහැකි තත්ත්වයට පත්වී තිබුණි.	සංවර්ධන සැලැස්මෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති බව.	යුතුය.

1.5.5 ශීර්ෂය 305 - දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	නාගොඩ ප්‍රාදේශීය රෝහලේ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට හා රෝගීන්ට ආහාර සැපයීම සඳහා තෝරා ගෙන තිබූ සැපයුම්කරු විසින් අමු ආහාර ද්‍රව්‍ය එම රෝහලේ අරක්කැමිගේ නිවසට අවිධිමත් ලෙස සපයා තිබූ අතර අරක්කැමි විසින් රෝහල වෙත දෛනිකව අවශ්‍ය කරනු ලබන අමු ආහාර ප්‍රමාණය පමණක් ඔහුගේ නිවසින් රැගෙනවිත් ආහාර පිළියෙල කරනු ලබන බවද විගණනයට නිරීක්ෂණය විය. සැපයුම්කරු විසින් සපයනු ලබන අමු ආහාර සහ දෛනික කෑම වට්ටෝරුවට අනුව එම ආහාර රෝගීන්ට හා සේවකයින්ට ලබා දෙනු ලබන බවට ප්‍රමාණවත් අධීක්ෂණයක් සහ එම ආහාරවල තත්ත්ව පරීක්ෂාවක් සිදු නොකරන බවද එම නිසා 2024 වර්ෂයේ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා අමු ආහාර වෙනුවෙන් ගෙවා තිබූ රු.1,948,775 ක මුදල් ඵලදායීව වැය කර තිබූ බවට විගණනයේදී පිළිගත හැකි තහවුරු සාක්ෂි නොවීය.	කෑම වට්ටෝරුවට අනුව රෝගීන්ට හා රෝහල් කාර්ය මණ්ඩලයට ආහාර සැපයීම සිදු කරන්නේද යන්න පිළිබඳව ආයතනභාර වෛද්‍ය නිලධාරී විසින් හදිසි පරීක්ෂාවන් සිදුකරනු ලබන බව.	විධිමත් අධීක්ෂණයක් යටතේ අදාළ කාර්යයන් ඉටුකල යුතු අතර ආහාරවල තත්ත්ව පරීක්ෂණයක් දෛනිකව සිදු කිරීමටද කටයුතු කල යුතුය.

(ආ) මතභේදයට තුඩුදුන් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරියෙකු 2023 ජනවාරි 22 දින සිට 2023 පෙබරවාරි 19 දින දක්වා අනුමැතියකින් තොරව විදේශගත වී තිබූ අතර එම කාලයේ රෝහල් ගත වී සිටියා සේ දක්වමින් දෙයියන්දර ප්‍රාදේශීය රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරී විසින් දින 10 ක් සඳහාද නැරවල්පිට ප්‍රාදේශීය රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරී විසින් දින 17 ක් සඳහාද වෛද්‍ය වාර්තා නිකුත් කර තිබුණි. නිවාඩු අනුමත කිරීම සඳහා පත් කර තිබූ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුවද 2023 පෙබරවාරි 01 සිට 2023 පෙබරවාරි 27 දින දක්වා මෙම නිලධාරියාට විවේක දින 27 ක් අනුමත කර තිබුණි. එකී නිලධාරියාගේ ඉල්ලීම මත විශ්‍රාම ගැන්වීමට කටයුතු කර තිබුණද 2023 පෙබරවාරි 27 දින නැවත සේවයට වාර්තා කර විශ්‍රාම යෑමේ ඉල්ලීම ඉවත් කර ගන්නා බව 2023 අප්‍රේල් 19 දිනැති ලිපිය මඟින් දැනුම් දී තිබූ අතර 2023 පෙබරවාරි 27 දින සිට 2023 ජුනි 30 දක්වා කාලය සඳහා නිලධාරියා වෙත රු.93,675ක් වැටුප් ලෙසද ගෙවා තිබුණි. තවද අදාළ නිලධාරීයාට හා සාවද්‍ය වෛද්‍ය වාර්තා නිකුත් කර තිබූ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 31.1.12 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙම කටයුතු සම්බන්ධව මූලික විමර්ශණයක් පැවැත්වීම සදහා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් මූලික විමර්ශන කමිටුවක් පත්කර ඇති බවත් එම කමිටු නිර්දේශයන් පරිදි ඉදිරි විනය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ඇ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාථමික සෞඛ්‍ය සේවා නගා සිටුවීමේ ව්‍යාපෘතියට සමගාමීව දකුණු පළාත් රෝහල් පරිගණක ජාලගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ නාගොඩ ප්‍රාදේශීය	මෙම කාර්යාලයේ හා ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සෞඛ්‍ය තොරතුරු ඒකකයන්ගේ මැදිහත්වීමෙන් පැවති ගැටළු මේවන	වත්කම් ඵලදායී ලෙස යොදවා ගැනීමට කටයුතු කල යුතුය.

රෝහල සඳහාද රු.299,117 ක මුදලක් වැය කර තිබූ අතර එම වැඩසටහන සඳහා රෝහල වෙත 2021 සහ 2023 වර්ෂවලද Bar cord reader, scanner සහ printer 03 ක් ලබාදී තිබූණද අනෙකුත් අවශ්‍යතා සපුරා නොතිබීම මත එම උපකරණ මේ දක්වාම නිෂ්කාර්යව පැවතුණි.	විට නිරාකරණය කොට නිශ්කාර්යව පැවති උපකරණ භාවිතයට ගැනීම සඳහා කටයුතුකර ඇති බව.

1.5.6 ශීර්ෂය 306 - දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (8), (9) වගන්ති	අධිභාර සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත අධිභාරලාභියා විසින් පළාත් පාලන කොමසාරිස් වෙත අදාළ මුදල ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා නොමැති නම් හා අභියාචනාවක් කර නොමැති නම් අදාළ තැනැත්තා පදිංචි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලුම් කර අදාළ මුදල් අයකර ගැනිමට පළාත් පාලන කොමසාරිස් විසින් කටයුතු කළ යුතු වුවත්, විගණකාධිපති විසින් විවිධ අවස්ථාවන්හිදී නිකුත් කළ රු. 7,507,556 ක අධිභාර සහතික 10 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකී නියමයන් අනුව කටයුතු කර නොතිබුණි.	අධිභාර 03 කට අදාළව මේ වන විට නඩු කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින බවත් එක් අධිභාරයක් සම්බන්ධව තීරණය ලැබී ඇතත් අදාළ අධිභාරකරුවන් නිදහස් කර ඇති බවත්, අධිභාර 06 ක් සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ තීරණය මෙතෙක් ලැබී නොමැති බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ii)	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/09/01/06/Digitalization- project හා	යොමුගත උපදෙස් ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දකුණු පළාතේ පළාත් පාලන ආයතන 34ක් විසින් මාර්ගගත ගෙවීම් පහසුකම් සලසා නොතිබුණ අතර හම්බන්තොට දිස්ත්‍රික් පළාත්	සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් මෙම මෘදුකාංගය ස්ථාපිත කිරීමට එකඟතාවය පලකර ඇති බව.	උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කල යුතුය.

	2023 දෙසැම්බර් 13 දිනැති උපදෙස් ලිපිය	පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් අධීක්ෂණය වන පළාත් පාලන ආයතන 05ක් විසින් එකතුව රු.2,507,500ක වියදමක් දරා ස්ථාපිත කර තිබූ මෘදුකාංග පද්ධති මඟින්ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මාර්ගගත ගෙවීම් පහසුකම් සලසා නොතිබුණි.		
(iii)	2023 අගෝස්තු 10 දිනැති අංක 01/11/roadapp දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපිය	යොමුගත උපදෙස් ලිපියට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් දකුණු පළාතේ පළාත් පාලන ආයතන 49 කට අයත් ග්‍රාම නිලධාරී වසම් 2125 කින් වසම් 436 කට අදාළව මාර්ග මැනුම්කර මාර්ග ඉන්වෙන්ට්‍රිය පිළියෙල කර නොතිබුණි.	පළාත් පාලන ආයතන වැඩි ප්‍රමාණයක් මැනුම් කටයුතු අවසන් කර හා අවසන් අදියරේ පවතින බව හා වර්තමාන ප්‍රගතිය නිරීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරනු ලබන බව.	උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 මූල්‍ය බලතල පැවරීම් අනුව පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල ප්‍රසම්පාදන කමිටු සීමාව රු.500,000ක් වූ අතර, රු.2,085,510ක වටිනාකමින් යුතු ටොයෝටා Hilux ද්විත්ව කාර්යය රථය අලුත්වැඩියාව සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කිරීමකින් තොරව යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ නිර්දේශ පමණක් සැලකිල්ලට ගෙන කටයුතු කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 වගන්තියට පටහැනිව කටයුතු කර තිබුණ අතර ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතිකවීම යන ප්‍රසම්පාදනයේ අරමුණු ඉටු වී නොතිබුණි.	මේ සඳහා ආයතන 04ක් වෙතින් ඉදිරිපත් කරනු ලැබූ මිල ගණන් ගාල්ල සහකාර කොමසාරිස් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමු කර නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව තෝරාගත් ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා විධිමත් පරිදි ගිවිසුම්ගත වී මෙම කාර්යය සාර්ථක ලෙස ඉටු කරවා ගෙන ඇති බව හා ප්‍රසම්පාදන තීරණය සටහන් නොකිරීම කාර්යාලීය අතපසුවීමක් බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ඇ) මතභේදයට තුඩුදුන් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලයට අදාළව රැස්කර තිබූ රු.693,381,608ක්වූ මුද්දර ගාස්තු ආදායමට අදාළව තොරතුරු උපලේඛනගත කිරීම වෙනුවෙන් කොමිස් මුදලක් ලෙස මුද්දර ගාස්තු ආදායමින් සියයට 03 කට සමාන මුදලක් එනම් එකතුව රු.21,217,468 ක් පළාත් පාලන ආයතනවල එම කාර්යයට සම්බන්ධ කාර්ය මණ්ඩලවල නිලධාරීන් 129 දෙනෙකු වෙත සහා අරමුදල් වලින් ගෙවීම් කර තිබුණි.		
(i) මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 185 (ඇ), නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 158 (ඇ) සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (ආ) වගන්ති ප්‍රකාරව 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත යටතේ ගෙවනු ලබන මුළු මුද්දර ගාස්තු ආදායම දකුණු පළාත් සභා අරමුදලට බැර වී තිබියදීත් මුද්දර ගාස්තු වලට අදාළ තොරතුරු උපලේඛන ගත කිරීම වෙනුවෙන් අදාළ නිලධාරීන් වෙත සංයුක්ත දීමනා, අතිකාල දීමනා ගෙවීමට හැකියාව තිබියදී දකුණු පළාත් ආණ්ඩුකාරවර අනුමැතිය මත පමණක් මෙම කොමිස් මුදල් ගෙවා තිබුණි.	2021 ජනවාරි 01 දිනැති අංක 4/04/01/2021 දරන චක්‍රලේඛය දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් නිසි අධිකාරිත්වය වෙතින් ලද නීත්‍යානුකූල බලය පරිදි නිකුත් කල චක්‍රලේඛයක් බව හා එහි සෑම වගන්තියක්ම එනයින් නීත්‍යානුකූල පදනමකින් හෙබි බව.	අදාල නෛතික රාමුව තුළ කටයුතු කල යුතුය.
(ii) 1984 නොවැම්බර් 20 දිනැති පළාත් පාලන අමාත්‍යාංශයේ සහකාර ලේකම්ගේ අංක 1984/19 දරන චක්‍රලේඛයේ විධිවිධාන ඉක්මවා දකුණු පළාත් ආණ්ඩුකාරවර අනුමැතිය මත 2021 ජනවාරි 01 දිනැති අංක 4/04/01/2021 දරන පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර තිබූ අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් ප්‍රතිපාදන සලසා තිබීම නිසා දකුණු පළාතේ පළාත්	- එම-	අදාල නෛතික රාමුව තුළ කටයුතු කල යුතුය.

පාලන ආයතනයන්හි ආදායම් පරීක්ෂකවරුන් ඇතුළු සභාවේ නිලධාරීන්ට අවස්ථා 119කදී කාර්යාල වේලාව තුළ වෙනත් සේවා ස්ථානයකට ගොස් තොරතුරු උපලේඛනගත කිරීම වෙනුවෙන් මාසික ඒකාබද්ධ වැටුප ඉක්මවා මසකට රු.50,000ත් රු.2,318,326 ත් අතර කොමිස් මුදල් එක් නිලධාරියෙකුට ගෙවා තිබුණි.

(ඇ) වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණු වර්ග මීටර් 2795ක වපසරයකින් යුත් ගොඩනැගිල්ල දැනට ගරා වැටීමේ අවදානමකට ලක්ව පවතින අතර ගොඩනැඟිල්ලෙන් කොටසක් පමණක් ආයතනයේ ලේඛනාගාරය ලෙස පවත්වාගෙන යනු ලබයි. මෙම ගොඩනැගිල්ල නිසි අළුත්වැඩියාවක් සිදු කර ඵලදායි කාර්යයකට යොදා ගත හැකිව පැවතියද හම්බන්තොට මහ නගර සභාවට අයත් භූමියක මෙම කාර්යාලයේ ලේඛනාගාරයේ කොටසක් පවත්වාගෙන යනු ලබන අතර 2024 පෙබරවාරි 27 දින සිට 2024 නොවැම්බර් දක්වා එකතුව රු.371,530ක් බිම්කුලී ලෙස ගෙවා තිබුණි.	පැරණි ගොඩනැගිල්ල 10km දුරකින් පිහිටීම නිසා ඒ වෙනුවෙන් ප්‍රවාහන වියදම් ද විශාල ලෙස දැරීමට සිදුවීම හා හදිසි අවස්ථාවකදී ලිපි ලේඛන සොයා බැලීම සඳහා යාමට ඒමට සිදු වීම ආදී හේතු නිසාවෙන් 2024 වර්ෂයේ සිට නව ලේඛණාගාරයක් පවත්වාගෙන යාමට කටයුතු කරන ලද බව.	ඵලදායි කාර්යයකට යොදා ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.7 ශීර්ෂය 308 - දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ			
• 2023 දෙසැම්බර් 29 දිනැති අංක 54/2023	යොමුගත විධිවිධාන ප්‍රකාරව සිසුන් 1000 කට වඩා වැඩි	මෙම වැඩසටහන වාර්ෂික සැලැස්මේ ඇතුළත් වූ නිසා ප්‍රසම්පාදන කමිටු ප්‍රකාරව	චක්‍රලේඛ විධිවිධාන කටයුතු

දරන පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධන සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය හා මාර්ගෝපදේශ අත්පොතෙහි 11.1 වගන්තිය	පාසලක භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා පාසල් ප්‍රසම්පාදන කමිටුවට රු.මිලියනයක් දක්වා පමණක් අනුමත කිරීමේ හැකියාව පැවතියද ගාල්ල දිස්ත්‍රික්කයේ පාසලක 2024 වර්ෂයේදී පාසල් ළමුන් සඳහා ටී ෂර්ට් 2000 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.2,850,000 ක් පාසල් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත පමණක් වියදම් කර තිබුණි.	අනුමැතිය යටතේ සිදුකර ඇති බවත් එසේ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව සිදු කිරීම වරදක් බවත් මින් ඉදිරියට එසේ නොකිරීමට කටයුතු කරන බව.	කල යුතුය.
• 2023 දෙසැම්බර් 29 දිනැති අංක 54/2023 දරන චක්‍රලේඛයේ 4.1.3.2, 7.1 (ඇ) සටහන (iii) හා 7.2 වගන්තිය	යොමුගත චක්‍රලේඛයේ විධි විධානවලට පටහැනිව එක් පාසලක 2024 වර්ෂයේදී පළමු ශ්‍රේණියට ඇතුළත් කරගත් සිසුන්ගෙන්, 06 ශ්‍රේණියට හා උසස් පෙළ සඳහා ඇතුළත් කරගත් සිසුන්ගෙන් පාසල් සංවර්ධන සමිති ගාස්තුව ලෙස එක් සිසුවකුගෙන් රු.2,000 ක මුදලක්ද, විශේෂ පරිත්‍යාග ලෙස එක් සිසුවකුගෙන් පිළිවෙලින් රු.5,000, රු.7,000 හා රු.10,000 ක් ආදී ලෙස එකතුව රු.3,547,000ක මුදලක්ද අයකර තිබුණි. තවත් බාලිකා පාසලක රු.2,896,630 ක මුදලක් පාසල් සිසුන්ගෙන් අය කරගෙන පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කර තිබුණි.	චක්‍රලේඛයට පටහැනිව මෙම මුදල් අය කර ගෙන ඇති බව හා ඉදිරියට චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතු බවට උපදෙස් ලබා දුන් බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ක්ෂේත්‍රගත නිලධාරින් විසින් ඉටු කරන ලද කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා දකුණු පළාත් අධ්‍යාපන ලේකම් විසින් සමලෝචිත වර්ෂයේ වැඩ කළයුතු දින 242 කින් දින 145ක් රාජකාරී ගමන් වෙනුවෙන් සංයුක්ත දීමනා ලෙස රු.145,000ක්ද සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දිනවල ගමන් වෙනුවෙන්	ලේකම්වරයා විසින් පාසල් හා අනෙකුත් අධ්‍යාපන පද්ධතිය තුල දියත් කර ඇති ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි ප්‍රගතිය අධීක්ෂණය කිරීම, කලාප කාර්යාල හා පාසල් අධීක්ෂණ කිරීම ආදි රාජකාරීන් ඉටුකිරීම වෙනුවෙන් සතියේ දිනවල සහ සති අන්තයේ සහ නිවාඩු දින	පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය කාලය ලබාගත හැකි වන පරිදි අධීක්ෂණය සඳහා අවශ්‍යම දින ගණනක් පමණක් යොදා ගැනීමට කටයුතු කල යුතුය.

	දින 87ක් සඳහා රු.86,500ක්ද ගෙවා තිබූ බැවින් එම ලේකම්වරයා අමාත්‍යාංශය තුළ කළ යුතු පරිපාලන කටයුතු සඳහා ප්‍රමාණවත් කාලයක් ගත කර නොමැති බව නිරීක්ෂණය විය.	මෙම දීමනා ලබාගෙන ඇති බව.	
(ii)	හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසලක් සම්බන්ධයෙන් සිදු කළ මූලික විමර්ශනයකින් විනය චෝදනාවකට ලක් වූ වයස අවුරුදු 59 ක් වූ ගුරුවරියකගේ ඉල්ලීමකට අනුව දින 90 ක් සඳහා විශ්‍රාම පූර්ව නිවාඩු අනුමත කර තිබුණද, එකී ගුරුවරිය විශ්‍රාම පූර්ව නිවාඩු ලෙස දින 110 ක් ලබා ගැනීමෙන් පසුව විශ්‍රාම පූර්ව නිවාඩුව අවලංගු කර නැවත සේවයට කැඳවා තිබුණි. ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 36.2 වගන්තිය පරිදි එම නිලධාරිනියගේ ඉල්ලීම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 12 වගන්තිය ප්‍රකාරව කටයුතු නොකර නැවත සේවයට කැඳවා තිබුණි. විශ්‍රාම පූර්ව නිවාඩු කාලසීමාව තුළ ලබාගත් නිවාඩු සඳහා හිලව් නිවාඩු සහ හිලව් කිරීමට නොහැකි නිවාඩු දින 47ක් සඳහා වැටුප් රහිත නිවාඩු ලෙස රු.158,332ක මුදලක් අයකර ගෙන තිබුණද විනය පියවර ගෙන නොතිබුණි.	වයස අවුරුදු 60 වන තෙක් තවදුරටත් සේවය කිරිමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර තිබුණු බැවින් විශ්‍රාම පූර්ව නිවාඩුව අවලංගු කර නැවත සේවයට කැඳවීමට අනුමැතිය ලබා දුන් බව.	විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(iii)	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 454.44 ක් වැය කර තිබූ අතර එයින් නව ඉදිකිරීම් හා නඩත්තු සහ නවීකරණයන් යන සංරචක දෙක සඳහා වෙන් කරන ලද රු.මිලියන 248.645ක් වූ ප්‍රතිපාදනයෙන් දරන ලද සත්‍ය වියදම රු.මිලියන 175.07 ක් විය. එය සමස්ත වියදමින් සියයට 39 ක ප්‍රතිශතයක් වූ එම වියදම් ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීම සඳහා සෘජුවම අදාළ නොවන පාසල් ඉදිකිරීම්, අලුත්වැඩියා සහ නවීකරණ කටයුතු වෙනුවෙන් වැය කර තිබුණි.	පාසල්වල අවශ්‍යතාවයන් හඳුනාගෙන ව්‍යාපෘතියට අවශ්‍ය සැලැස්ම සකස් කොට ප්‍රධාන ලේකම් හරහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ලෝක බැංකු එකඟතාවය මත එය අනුමත වූ පාසල්වල ව්‍යාපෘති ක්‍රියාත්මක කල බව.	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියට අදාළ ප්‍රතිපාදන වෙන් කළ යුතු ව්‍යාපෘති සංරචකයන් සඳහන් කරන උපදෙස් මාලාව ප්‍රකාරව කටයුතු කරමින් ව්‍යාපෘති අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කල යුතුය.

(iv) දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට උපාධිධාරි ගුරුවරුන් බඳවා ගැනීමේදි,		
(ඒ) ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවෙහි 7.2.3.4 වගන්තිය අනුව පාසල් පාදකව බඳවා ගැනීම සිදු නොකොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බඳවා ගැනීම සිදුකිරීම හේතුවෙන්, පරික්ෂාවට ලක් කළ විෂයන් 04 ක ඉහළ ලකුණු ලබා සුදුසුකම් සපුරාගත් අයදුම්කරුවන් 94 දෙනෙකු හට පත්වීම් ලබාදීම සඳහා සළකා බැලිමක් සිදු කර නොතිබුණි.	2020 ජනවාරි 03 දින රේඛිය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති සේවක සංඛ්‍යාව නිර්ණය කිරීම සහ සමාලෝචනය කිරීම පිළිබඳ රැස්වීමේ රැස්වීම් සටහනේ අංක 5 තීරයේ 3 වන වගන්තිය අනුවද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගුරුවරුන් බඳවා ගැනීමට හැකිවන පරිදි ගුරු සේවා ව්‍යවස්ථාව වෙනස් කල යුතු බවට යෝජනා කර ඇති බව.	ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(බී) යථෝක්ත සේවා ව්‍යවස්ථාවේ 7.2.4.3 (අ) (ii) තෝරා ගැනීමේ ක්‍රමය යන වගන්තිය අනුව ව්‍යවස්ථාවේ 7.2.4.1 හි හා 7.2.4.4.1(2) හි සඳහන් පරිදි ලකුණුමත පදනම්ව පාසල් පාදකව ස්ථාන ගත නොකර පුරප්පාඩු දැන්වීමේ සඳහන් පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පත්වීම් ලබා දීමේදීද එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉහළ ලකුණු ලබාගත් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් සිටියදී, පහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් 07දෙනෙකු හට විෂයයන් කිහිපයක් සඳහා පත්වීම් ලබාදීමට කටයුතු කර තිබීම හේතුවෙන් ඉහළ ලකුණු ලබා සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් 05 දෙනෙකු හට පත්වීම් අහිමි වි තිබුණි.	පත්වීම් 04 ක් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් අයදුම් කල ආබාධිත අයදුම්කරුවන් 04 කටද එක් පත්වීමක් ස්වාමීන් වහන්සේ නමකට අනෙක් පත්වීම සුදුසුකම් නොමැති වීම මත ලබා දුන් පත්වීම වෙනුවට ලබා දුන් වෙනත් පත්වීමක් වු බව හා කිසිදු අයදුම්කරුවෙකු වෙත අසාධාරණයක් සිදුව නොමැති අතර නිවැරදි ක්‍රමවේදය යටතේ පත්වීම් ලබා දී ඇති බව.	ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(v)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ VIII පරිච්ඡේදයේ 9.6 වගන්තියට පටහැනිව ක්ෂේත්‍ර රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් 04 දෙනෙකු වෙත හිළව් නිවාඩු ලබාදීමට කටයුතු නොකර නිවාඩු දින වැටුප් ලෙස රු.671,949ක් ගෙවා තිබුණි.	ඉදිරියේදි දින වැටුප් ලබාදිමේදි පවරන ලද විශේෂ රාජකාරි විස්තර හෝ අදාල කැඳවීම් ලිපි හා සහභාගී වු බවට සනාථයන් ලබාගෙන හා අදාල කාර්යය තුළ පැය 08 ක අවම කාලයක් නිරත කරගනිමින් දින වැටුප් ගෙවීමට නිලධාරින් දැනුවත් කර ඇති බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ඇ) ප්‍රසම්පාදනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 වගන්තිය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු ක්‍රමයේදී ලංසු කැඳවිය යුතු අවම කාල සීමාව ලෙස දින 21 ක් ලබා දීමට කටයුතු නොකර දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලීය වැය විෂයයන් 02කින් ලද ප්‍රතිපාදන වලින් පාසල් සිසුන් සඳහා පාසල් බෑග් බෙදාදීම වෙනුවෙන් සිදුකරනු ලැබූ එකතු වටිනාකම රු.14,480,000 ක් වූ මිලදී ගැනීම් 02 කට අදාළව පල කරන ලද ප්‍රසම්පාදන දැන්වීම් 02 හි ලංසු ඉදිරිපත් කිරීමේ අවම ලංසු කාලය ලෙස පිළිවෙලින් දින 03 ත් 05ත් අතර ඉතාම කෙටි කාලයක් පමණක් ලබා දී තිබීමෙන් තරඟකාරී ලෙස හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඒ අනුව පාසල් බෑග් සඳහා ආයතන දෙකක් විසින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, පාසල් උපකරණ සඳහා ආයතන 06 ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ගතවූ කාලය දින 03 ක් 05 ක් වූ බැවින් සමස්ථ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රසම්පාදන අරමුණුවලට අනුව සිදු වූ බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය.

1.5.7.1 දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

(අ) නොවිසඳී ඇති විගණන ඡේද

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගලගොඩ වැඩ අංගනයේ සවිකර තිබූ ඇස්පෝල්ට් යන්ත්‍රය වෙන්දේසි කිරීමේදී තක්සේරු කාර්යය සඳහා පත්කළ කමිටුව මඟින් වත්කම සඳහා ලබා දුන් තක්සේරුව රු.10,400,000ක් වූ අතර යන්ත්‍රය වෙන්දේසියේදී රු.21,100,000කට අලෙවි වී තිබුණි. මේ අනුව තක්සේරු වටිනාකම නිවැරදි නොවන බවද තක්සේරු කිරීමේදී යන්ත්‍රය තුළ වූ තාර ලීටර් 21782ක් හා ඩීසල් ලීටර් 4028ක් පිළිබඳව සැලකිල්ලට නොගෙන තක්සේරු කර තිබීමෙන් අධිකාරියට රු.3,274,784ක් පාඩු වී තිබුණි.	යන්ත්‍රය තුල වූ තාර සහ ඩීසල් පිළිබඳ සැලකිලිමත් නොවීම මෙම යන්ත්‍රය සම්බන්ධ වූ අධිකාරියේ නිලධාරීන්ගේ දැඩි නොසැලකිලිමත්භාවය පෙන්නුම් කරන බව හා මේ සම්බන්ධයෙන් තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡාවට ලක් කරමින් පවතින බව.	වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එම පාඩුව කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.

1.5.8 ශිර්ෂය 310 - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල්වල අ.පො.ස (සා/පෙළ) සිසුන් ඉලක්ක කර ගනිමින් 2024 වර්ෂයේ දී ගණිතය සහ විද්‍යා විෂය සඳහා විෂය සංවර්ධන වැඩසටහන් පවත්වා තිබූ පාසල් 47 ක සිසුන් 1985ක් ගණිත විෂය සඳහාත් පාසල් 31 ක සිසුන් 1621 ක් විද්‍යා විෂය සඳහාත්, සහභාගී කර ගෙන නිබන්ධන හා පෙරහුරු පරීක්ෂණ සකස් කර විෂය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී එක් එක් විෂය ඒකක ඉතා සුළු ප්‍රමාණයක් පමණක් ආවරණය වන ආකාරයට පවත්වා තිබූ අතර විෂය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහි අරමුණ වන සිසුන්ගේ සමස්ථ විෂය දැනුම ඉහළ නැංවීමට වන දායකත්වය අවම මට්ටමක් විය.	සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය වන පරිදි සකස් කළ පෙරහුරු පරීක්ෂණ මගින් ශිෂ්‍ය සම්මන්ත්‍රණ ක්‍රියාත්මක කරන බව.	සම්පූර්ණ විෂය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කල යුතුය.

1.5.9 ශීර්ෂය 311 - දකුණු පළාත් ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

1.5.9.1 කාර්මික සංවර්ධන අධිකාරිය

(අ) ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අධිකාරිය වෙනුවෙන් වෙබ් පිටුවක් නිර්මාණය කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු.700,000ක ගෙවීමක් සිදුකර තිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි කටයුතු අවසන් කර නොතිබියදීත් එම වටිනාකම ප්‍රාග්ධනිත කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.
(ii)	අමාත්‍යාංශ ප්‍රතිපාදන සහ අධිකාරියේ අරමුදල් මඟින් දෙනිපිටිය හා මීටියාගොඩ මධ්‍යස්ථාන සඳහා රු.2,873,823ක වියදමක් දරා සූර්ය පැනල සවිකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සම්බන්ධතාවය ලබාදී නොතිබියදීත් එකී වටිනාකම ප්‍රාග්ධනිත කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.

(ආ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදය			
•	3.1, 3.2 හා 3.5 ඡේද	යොමුගත විධිවිධානවලට අනුකූල නොවන පරිදි කාර්මික සංවර්ධන අධිකාරියේ මධ්‍යස්ථානවල අධීක්ෂණ කටයුතු සිදුකරන නිලධාරින්ට	අධිකාරී කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 03 ක් පැවතීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති අතර මේ සඳහා බඳවා ගැනීම් සිදු කිරීම හරහා මෙම තත්ත්වය ඉදිරියේදී මඟහරවා	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

		තමාට පැවරි ඇති සාමාන්‍ය රාජකාරීන් ඉටුකිරීම වෙනුවෙන් රු.519,795ක අතිකාල දීමනා ගෙවා තිබුණි.	ගැනීමට කටයුතු සිදු කරනු ලබන බව.	
•	4.1 ඡේදය	යොමුගත විධිවිධානවලට අනුකූල නොවන පරිදි කාර්මික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 06 දෙනෙකු වෙත ඉටු කරන ලද අධීක්ෂණ කාර්යයන්ට අදාලව සමාලෝචිත වර්ෂය තුළදී රු.545,789ක අතිකාල දීමනා ගෙවීම් කර තිබුණි.	එක් නිලධාරියකු සඳහා මධ්‍යස්ථාන කිහිපයක් අධීක්ෂණයට මෙන්ම සංවර්ධන සැලැස්මේ රාජකාරිද ඉටුකිරීමට රාජකාරී පවරා ඇති බැවින් මෙසේ ගෙවීම් කර ඇති බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ii)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) හා 2023 මැයි 12 දිනැති අංක 02/2021 (VIII) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් පැමිණීම හා පිටවීම සනාථ කිරීමකින් තොරව කාර්මික සංවර්ධන අධිකාරිය විසින් නිලධාරීන් 05 දෙනෙක් සඳහා රු.1,149,250ක අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම් කර තිබුණි.	ප්‍රධාන කාර්යාලය තුළ නිවාඩු දිනයන්හි රාජකාරී කටයුතු සිදු කරනු ලැබුවහොත් එහි ඇති ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් අනුව අතිකාල ගෙවීම් සිදුකරන බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ඇ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(i)	රිදියගම මත්ස්‍ය බීජ මධ්‍යස්ථානයේ දෙවන අදියර යටතේ ඉදිකර තිබූ ටැංකි 11න් ටැංකි 10ක් ම භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවති අතර ඉන් ටැංකි 04ක් 2022 වර්ෂයේදී රු.1,114,459ක පිරිවැයක් දරා ඉදිකර තිබුණි. තවද, රිදියගම මත්ස්‍ය බීජ මධ්‍යස්ථානය සඳහා අක්කර 10ක ඉඩමක් 2023 වර්ෂයේ ජුනි මස 07 වන දින ධීවර හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය විසින් කාර්මික සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණු නමුත් වසර 1 ½ කට ආසන්න කාලයක් මෙම ඉඩම කිසිදු කාර්යයක් සඳහා භාවිතා කර නොතිබූ අතර 2023 වර්ෂයේ පොල් පැළ 84ක් සිටුවා තිබුණද නිසි නඩත්තුවක්	රිදියගම මධ්‍යස්ථානය සඳහා ලැබුණු නව අක්කර 8ක භූමිය ඵලදායී අයුරින් භාවිතා කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති සකස් කර ඇති බව.	වත්කම් උපරිම ඵලදායීතාවයක් ලැබෙන අයුරින් භාවිතා කල යුතුය.

	නොමැති කමින් මේ වන විට එම පොල් පැල සම්පූර්ණයෙන්ම විනාශ වීමට ලක්වී තිබුණි.		
(ii)	රුවිනිගම බහුකාර්ය මධ්‍යස්ථානයේ පවතින ඉඩකඩ ප්‍රමාණයෙන් ඉතා සීමිත ඉඩ ප්‍රමාණයක් පමණක් අධිකාරිය විසින් නිෂ්පාදන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගෙන තිබූ අතර ගොඩනැගිල්ල තුල විශාල ඉඩකඩ ප්‍රමාණයක් නිෂ්කාර්යව පැවතිණි. තවද එම භූමිය ඵලදායී කටයුත්තකට යොදා නොගෙන වල් බිහිවී පැවති අතර ගොඩනැඟිලි සියල්ල පිළිසකර කල යුතු මට්ටමේ පැවතුණි.	ගොඩනැගිල්ලේ කාමර විවිධ කාර්යන් සඳහා යොදා ගෙන ඇති බවත් භූමිය තුල පොල් පැළ 22 ක් සිටුවීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	වත්කම් උපරිම ඵලදායීතාවයක් ලැබෙන අයුරින් භාවිතා කල යුතුය.

1.5.10 ශීර්ෂය 313 - දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

(අ) ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙණු සීමා නොපිළිපැදීම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පේෂ හා කුඩා කර්මාන්ත අත්තිකාරම් ගිණුමට අදාළව අනුමැතිය ලබාදී තිබූ වියදමේ හා හර ශේෂයේ උපරිම සීමාව පිළිවෙලින් රු.300,000,000ක් හා රු.244,848,741ක් ද, තථ්‍ය වියදම හා හර ශේෂය පිළිවෙලින් රු.421,631,382ක් හා රු.300,300,039ක් ද වීම නිසා සීමාවන් පිළිවෙලින් රු.121,631,382කින් හා රු.55,451,298කින් ඉක්මවා තිබුණි.	2024 මුදල් ප්‍රකාශයේ 11 වැනි කොටසේ දැක්වෙන විෂය අංක 31302 දරන දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තු වාණිජ අත්තිකාරම් ගිණුමේ සීමාවන් ඉක්මවා ගොස් ඇති බව.	අනුමත සීමාවන් තුළ කටයුතු කල යුතුය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අහංගම හා අලුත්වල ලුහු ඉංජිනේරු, අමලගොඩ දැව තාක්ෂණ ආයතනය හා අගුල්මඩුව පිත්තල කර්මාන්තායතනය යන ආයතනවල පුහුණුවීම සඳහා සිසුන් ලියාපදිංචි වීම අවම මට්ටමක පැවති අතර පාසල් මට්ටමින් මෙම පාඨමාලා හා ඒවායේ වැදගත්කම පිළිබඳව පාසල් හැර යාමට පෙර සිසුන් දැනුවත් කිරීම වැනි ක්‍රම හරහා පාඨමාලා සඳහා සිසුන් යොමු කරවා ගැනීම කෙරෙහි කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි.	සාමාන්‍ය පෙළ සමත් හෝ අසමත් ඕනෑම සිසුවෙකුට උසස්පෙළ වෘත්තීය විෂය ධාරාව යටතේ උසස් අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථාව ලබාදීම හරහා පාසල් සිසුන් ආකර්ශනය කර ගැනීමට හැකිවීම නිසා ඉදිරි වසර තුළ මෙම ගැටලුව අවම කර ගැනීමට හැකිවෙතැයි අපේක්ෂා කරන බව.	සිසුන් දැනුවත් කර පාඨමාලා සඳහා සිසුන් යොමු කරවා ගැනීම කෙරෙහි ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය.

(ii) ජාතික අවශ්‍යතාවයක් ලෙස පවත්වාගෙන යනු ලබන ජාතික අත්යන්ත්‍ර, පේෂ කර්මාන්ත රෙදිපිළි තරඟාවලිය සඳහා නිෂ්පාදනය කල වටිනාකම රු.11,688,343ක් වූ ප්‍රදර්ශන අයිතම අලෙවිය සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. රුහුණු රන්සළු නිමවුම්හල් වල ස්ථානභාර නිලධාරීන් ලෙස සේවය කරනු ලබන පේෂ උපදේශිකාවන් මෙම කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා දීර්ඝ කාලීනව ශ්‍රමය යොදවනු ලබන අතර කාර්මිකාවන්ගේ සහාය ලබාගෙන ප්‍රදර්ශනයේ නිර්මාණ කටයුතු සිදු කෙරෙන නිසා ආර්ථිකමය වශයෙන් නිමවුමක් උත්පාදනය කිරීම සඳහා යොමු කල හැකි විශාල කාලයක් මෙම කාර්යය සඳහා ගත වී තිබූ බවත් නිරීක්ෂණය විය.	ඉදිරියේදී වෙළඳපල ඉල්ලුම අවම නිර්මාණ පාලනයක් සහිතව සිදු කිරීමට උපදෙස් දෙන ලද බව.	මෙම ප්‍රදර්ශන භාණ්ඩ අලෙවි කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සැකසිය යුතුය.

(ඇ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මාතර - කොළඹ ප්‍රධාන මාර්ගයට මුහුණලා හබරාදූවේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ලේ ඉහල මහල හා වටිනාකම රු.297,571 ක් වූ අමලගොඩ දැව තාක්ෂණික ආයතනයේ යන්ත්‍ර 03 ක් කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.	ඉහල මහලෙහි අලෙවිසැල පසෙකින් ඇති කොටස බදු දීමටත් හෝ වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමටත් යන්ත්‍ර අළුත්වැඩියා කටයුතු සිදුකර සිසුන්ගේ පුහුණු අවශ්‍යතා සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව.	වත්කම් උපරිම ප්‍රයෝජනයක් ලැබෙන පරිදි භාවිතයට ගත යුතුය.

1.5.11 ශීර්ෂය 314 - දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජල සම්පාදන හා ජලාපවහන, වෙළඳ, ආහාර සැපයීම් හා බෙදාහැරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක තෝරාගන්නා ලද ප්‍රතිලාභීන් 1570ක්	ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘති සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී අඩුපාඩු අවම වන අයුරින් කටයුතු කිරීමට වගබලා ගන්නා බව.	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකිවන අයුරින් ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය.

සඳහා රු.මිලියන 7.5ක් වැය කරමින් මිරිස් පැල වගා මලු සහ පොහොර සැපයීම් කර රුපියල් මිලියන 141.3ක අස්වනු ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද, 2024 මැයි 31 දින වන විට රුපියල් මිලියන 11ක පමණ ආදායමක් ලබාගෙන තිබුණු අතර මෙම ව්‍යාපෘතිය මාස 05ක් වැනි කෙටි කාලයක් තුල අත්හැර දමන ලද ව්‍යාපෘතියක් බවටද පත්වී තිබුණි.		

1.5.12 ශීර්ෂය 315 - දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

(අ) අවිධිමත් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා වන නම්‍යශීලී අරමුදල මගින් කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා සියයට 50 ආධාර යටතේ කොම්පෝස්ට් හලන යන්ත්‍රයක් සහ කැබලි කරන යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.1,000,000ක් එක් ප්‍රතිලාභියෙකුට පමණක් ලබාදී තිබූ අතර මෙම මිලදී ගැනීම සඳහා අරමුදල් සැපයීමේදී ප්‍රසම්පාදන චක්‍රලේඛ අනුගමනය කිරීම මෙන්ම ආයතනයේ කිසිඳු මැදිහත්වීමකින් හා විනිවිදභාවයකින් තොරව අදාල ව්‍යවසායකයාගේ අභිමතය පරිදි මිලදී ගැනීම සිදුකර තිබුණි. තවද, ප්‍රතිලාභියා සමඟ විධිමත් ආකාරයේ කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මෙම යන්ත්‍ර කිසිඳු නිෂ්පාදන කටයුත්තකට යොදවා නොගැනීම නිසා නිෂ්කාර්යව පැවතුණි.	මේ සම්බන්ධයෙන් දකුණු පළාත් සභාවේ නීති නිලධාරී හමුවී උපදෙස් ලබාගන්නා ලද බවත් එම උපදෙස් අනුව මෙම ප්‍රතිලාභියා, උපකරණ ලබා ගැනීමට අදහස් කරන නව ප්‍රතිලාභියා හා දෙපාර්තමේන්තු නිලධාරීන් අතර සාකච්ඡාවක් පවත්වා ඉදිරි කටයුතු සිදුකරන බව.	ව්‍යාපෘති සිදු කිරීමේදී වඩාත් විනිවිදභාවයකින් සිදුකිරීමට හා නීති නිලධාරී ලබාදී ඇති උපදෙස් අනුව කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (HORDI) විසින් 2018 වර්ෂයේ රු.731,880කට මිලදී ගෙන දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මාතර පාංශු විද්‍යාගාරයට ලබාදී තිබූ වර්ණාවලිමානය (Spectrophotometer) ක්‍රියාවිරහිත වීම නිසා අලුත්වැඩියා කර ගැනීමේ ඇස්තමේන්තුව රු.2,269,930ක් වූ අතර එය යන්ත්‍රයේ පිරිවැය මෙන් තුන් ගුණයකටත් වඩා අධික මුදලක් විය. ප්‍රසම්පාදන කමිටුව විසින් අලුත්වැඩියාව සිදුකර ගැනීමට තීරණය කර තිබුණද ඉදිරිපත් කර තිබූ අලුත්වැඩියා ඇස්තමේන්තුව සම්බන්ධයෙන් අදාළ කාර්මික වාර්තා හෝ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සකස් කර නොතිබුණි.	උක්ත ආයතනය ඉදිරිපත් කර ඇති මිල ගණන් වෙළඳපොල පවතින වර්තමාන මිළ හා සැසඳෙන බව දන්වා ඇති අතර ඒ අනුව එම නිර්දේශ අනුව එම යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර ඇති බවත් අදාල අළුත්වැඩියා කටයුතු සිදුකර බිල්පත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගන්නෝරුව වෙත යොමුකර ඇති අතර වර්තමානයේ මෙම යන්ත්‍රය නිසි ක්‍රියාකාරිත්වයෙන් පරීක්ෂණ කටයුතු සඳහා දායක කර ගන්නා බව.	අළුත්වැඩියා කටයුතු සිදු කිරීමේදී තාක්ෂණික හා කාර්මික වාර්තා ලබාගත යුතුය.

1.5.13 ශීර්ෂය 316 - දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

(අ) අවිධිමත් ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ඉහළ සමෝච්ඡ රේඛා සිතියම් නිර්මාණය කිරීමට හැකිවන ඩ්‍රෝන කැමරා භාවිතයෙන් සමීප ඡායාරූප ලබා ගැනීමේ ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 20 දින ටෙන්ඩර් කැඳවීම් සිදුකර 2022 දෙසැම්බර් 28 දින ගිවිසුම් අත්සන් කර 2022 දෙසැම්බර් 31 දින රු.7,886,825ක මුදලක් ගෙවීම් කර තිබුණු අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ	අදාළ ඩ්‍රෝන තාක්ෂණික ප්‍රතිඵලය නිවැරදිව පෙළ ගස්වා ඉදිරියේදී දෙපාර්තමේන්තුවේ අභිවෘද්ධිය උදෙසා භාවිතා කිරීමට කටයුතු කරන බව.	ප්‍රතිඵලයන් ඵලදායී ලෙස දෙපාර්තමේන්තුව වෙත ලගා කර ගත හැකි ලෙස අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය.

	අවශ්‍යතාවයන්ගෙන් බැහැරව කටයුතු කර තිබුණි. තවද, වාරි කළමණාකරණයට අදාළ සැලසුම් සකස් කිරීමේදී හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අභිවෘද්ධියට ව්‍යාපෘතිය මගින් ලබාගත් සමීප ඡායාරූප ඇතුළු ප්‍රතිඵල භාවිතා කර නොතිබුණි.		
(ii)	දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවි කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) හා භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.28,707,068ක වියදමක් දරා තිබුණද, අදාළ පද්ධතිවලට ප්‍රවිෂ්ට වීමට පවා නොහැකිව තොරතුරු පද්ධතිය නිෂ්කාර්යව පැවතුණි.	ආයතනය සමඟ සාකච්ඡා සිදු කර අවශ්‍යතාවයන්ට සරිලන පරිදි මිල ගණන් ලබා ගෙන නැවත සක්‍රීය කිරීමට කටයුතු කරන බව.	වෙබ් අඩවි යාවත්කාලීන කර ගැනීමට කටයුතු සිදුකල යුතුය.
(iii)	දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් භූගෝලීය තොරතුරු පද්ධතියට අදාළව එක් සිසුවෙකුට එක සිතියමක් සිතියම්ගත කිරීමට දින 02ක් ගත වීමේ පදනම මත වාරිමාර්ග අධ්‍යක්ෂගේ ප්‍රමුඛත්වය යටතේ පත්කළ කමිටුවක් මගින් පුහුණු සිසුන් 15 දෙනෙකුට 2017 මාර්තු, අප්‍රේල් හා ජූලි මාසවලදී එක් සිතියමකට රු.2,000 බැගින්ද මැයි හා ජූනි මාසවලදී එක් සිතියමකට රු.700 බැඟින්ද රු.6,646,238ක මුදලක් හා සිසුන් සඳහා රු.357,720ක් අර්ථසාධක අරමුදලටද ගෙවීම් කර ඇති බවත් ඒ අනුව සිතියම් 4000 කට ආසන්න ප්‍රමාණයක් නිම කළ යුතුව තිබුණි.එහෙත් 2017 මැයි හා ජූනි මාසවලදී සිසුන් 15 දෙනෙකු සිතියම් 1138 ක් පමණක් සිතියම්ගත කර තිබූ බව ප්‍රකාශකර තිබුණද සිසුන් 15 කට දින 60ක් අඛණ්ඩව වැඩ කිරීම මත සිතියම්ගත කළ හැක්කේ සිතියම් 450 ක් බැවින් සිතියම් 1138 ක් සිතියම් ගත කිරීම් කර තිබූ බවට දැක්වීම විගණනයට ගැටළු සහගත විය.	මැයි හා ජූනි මාසවල සිසුන් 15 දෙනෙකු වෙත රු.700 බැගින් සිතියම් 1138ක් සඳහා ගෙවීම් කර ඇත්තේ සිතියම් ගත කිරීම් සඳහා නොව සිතියම් අනුව දත්ත රැස් කිරීම් සඳහා වේ.	අදින ලද සිතියම් ගණන පදනම් කර ගනිමින් අදාළ ගෙවීම් සිදුකර ඇති බව නිරීක්ෂණය වන බැවින් විධිමත් පරීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කල යුතුය.

1.5.14 ශීර්ෂය 317 - දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති වලින් විගණනය කර අවසන් කර තිබූ ගිණුම් වෙනුවෙන් 2024 ඔක්තෝබර් 31 දින වන විට රුපියල් මිලියන 301ක මුදලක් සමුපකාර සංවර්ධන අරමුදලට අයවී නොතිබුණු අතර ඊට අදාළ කාල විශ්ලේෂණයක්ද, දැනට අක්‍රීය සමිතිවලින් ලැබිය යුතු මුදල් පිළිබඳ වාර්තාවක්ද ඉදිරිපත් නොවීය.	වර්තමානයේ එම මුදල් ගෙවීමට ඇතැම් සමිතිවලට මූල්‍ය ශක්‍යතාවයක් නොමැති බව හා අයවිය යුතු මුදල් පැහැර හරිනු ලබන සමිති සම්බන්ධයෙන් ගතහැකි නෛතික ප්‍රතිපාදන නොමැති බව.	අරමුදලට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ii)	සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ පොදු බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.20,149,419ක ශේෂයක් පැවතුණද තීරක ගාස්තු හා නිරවුල් නොවූ උසාවි දඩ ශේෂයන් පිළිබඳව වෙන්කරන ලද වාර්තාවක් නොතිබූ අතර උසාවි දඩ හා තීරක ගාස්තු ගෙවීමේදී පොදු තැන්පත් ආපසු ගෙවීමකදී භාවිතා කරන රික්විසිෂන් පත්‍ර භාවිතා කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂයට එදිනට පවතින තීරක අතිරික්තයේ ශේෂය, නිරවුල් නොවූ උසාවි දඩ ශේෂය හා නිරවුල් නොකල අත්තිකාරම් ශේෂය යන ශේෂ 03 හි එකතුව සමාන විය යුතු වුවත් එම ශේෂ අතර රු.8,905,254ක වෙනසක් පැවතුණි.	ඈවර කිරීමට යෝජිත සමිතිවලට අදාලව උසාවි දඩ රු.220,935ක්ද, අක්‍රීය සමිතිවල උසාවි දඩ මුදල රු.1,152,113ක්ද, ලෙජර්ගත නොවූ උසාවි දඩ ශේෂය රු.4,687,394ක්ද, සමිති විසින් තමාට අයත්නොවන උසාවි දඩ මුදල් නැවත කාර්යාලයට ප්‍රේෂණය කිරීම (2010-2023) රු.1,576,129ක්ද මාසික ප්‍රගති වාර්තාවේ පැවති ශේෂය රු.10,001,460 ක්ද බව.	අදාල ශේෂයන් කඩිනමින් නිරවුල් කර ගත යුතුය.

(ආ) අවිධිමත් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නිරවුල් කර නොතිබූ උසාවි දඩ හා ප්‍රේෂණ ගැටළු නිරාකරණය කර ගැනීමට වැඩසටහනක් වෙනුවෙන් සමුපකාර කොමසාරිස් විසින් 2023 ජූලි	ඉදිරියේදී එම ප්‍රගතිය විගණනයට වාර්තා කරනු ලබන බව.	ලද මුදල් සඳහා ලදුපත් නිකුත් කර, අදාළ කාරණය සටහන් කිරීමට කටයුතු කල යුතුය.

20 දින සමුපකාර අරමුදලේ වියදමින් වැඩ සටහනට සහභා/ී වන අයට තේ පැන් හා දිවා ආහාරය ලබාදීමට ප්‍රතිපාදන ලබාදෙන බව දන්වා දිස්ත්‍රික්ක 03 හි උසාවි නිලධාරීන් සඳහා වැඩමුළුවක් පවත්වන ලෙස සහකාර කොමසාරිස්වරුන්ට ලිපි යොමුකර දැනුම් දී තිබූ අතර මාතර දිස්ත්‍රික්කය වෙනුවෙන් සමූපකාර සංවර්ධන අරමුදලින් රු.173,200ක් වියදම් දරා තිබුණි. එහෙත් මාතර වැඩබලන සමුපකාර සහකාර කොමසාරිස් විසින් 2023 ජූලි 06 දින සමුපකාර සමිති වලට ලිපි මගින් දැනුම් දී රු.216,000 මුදලක් එකී සමුපකාර සමිති වලින් එකතු කිරීමට අපේක්ෂා කරන බව දන්වමින් 2023 අගෝස්තු 08 දින මාතර දිස්ත්‍රික්කය තුළ ඇති සමුපකාර සමිති 61ක් වෙත දෙපාර්තමේන්තු ලිපි ශීර්ෂ මඟින් අනුග්‍රහය දක්වන ලෙස ලිපි යොමු කර රු.191,535ක් මුදල් එකතු කර තිබූ නමුදු ඒ වෙනුවෙන් කිසිඳු ලදුපතක් නිකුත් කර නොතිබුණි. එසේම එකතු කර තිබූ මුදල කවර නිලධාරියෙකු භාරයේ පවතින්නේද, එම මුදල වැය කර තිබූ ආකාරය පිළිබඳව තොරතුරු කිසිවක් නොතිබුණි.

1.5.15 ශීර්ෂය 318 - දකුණු පළාත් ක්‍රීඩා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන, සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම්, මිනිස් බල හා රැකී රක්ෂා අමාත්‍යාංශය

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	වදුරඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස ආධාර ලබා දීමේදී ආබාධිත තත්ත්වයේ පසුවන අනාරක්ෂිත නිවාසවල ජීවත්වන නිවාස ආධාර ලබා දීම වඩාත් සුදුසු තැනැත්තන් තෝරා ගෙන ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් මගින්ද තවදුරටත් තහවුරු කරගෙන ආධාර	ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කර තිබූ අයදුම්පත්‍ර 05න් 2024 අගෝස්තු 12 දින ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර 2024 අගෝස්තු 30 දිනැතිව නිවාසාධාර ලබාදීමට සුදුසු තෝරාගත් ප්‍රතිලාභින් සම්බන්ධව නිවාස කොමසාරිස්ගේ	ව්‍යාපෘතියේ අරමුණු ලබා කර ගැනීමට කටයුතු කල යුතුය.

	ගෙවීමට කටයුතු කළ යුතු වුවත්, නිවාස ආධාර ලබා දීමට තෝරාගත් පුද්ගලයින් තිදෙනාම නිකුත් කල උපදෙස් මාලාවට අනුව නිවාස ආධාර ලබා ගැනීමට වඩාත් සුදුසුකම් සහිත තැනැත්තන් වී තිබුණි.	අනුමැතිය ගොනු සටහන් යොදා ලිඛිතව ලබා ගෙන ඇති බව.	
(ii)	දකුණු පළාත් නිවාස කොමසාරිස් විසින් 2024 ජනවාරි 26 දින පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිවාසාධාර ලබාදීම සම්බන්ධව උපදෙස් මාලාවක් නිකුත් කර තිබියදී, සමාලෝචිත වර්ෂයේ දක්ෂිණපාය ජන මෙහෙවර ජංගම සේවා වැඩසටහන පැවැත්වීමේ අරමුණින් 2024 ජූලි මස 04 වන දින මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වෙත උපදෙස් මාලාව දෙයාකාරයකට සංශෝධනය කර නිකුත් කර තිබුණි. නිවාස දෙපාර්තමේන්තුවෙහි වාර්ෂික සැලැස්මට ඇතුළත් නොවූ මෙම වැඩසටහනට ආණ්ඩුකාරවර ප්‍රතිපාදන යටතේ සිදුකර තිබූ අතර රු.100,000 බැගින් වූ නිවාසාධාර ලබාදී තිබූ නිවාස නියැදි විගණන පරීක්ෂාවේදී බොහෝ දෙනා වෙත නිවාසාධාර අයදුම්පත ප්‍රදේශයේ දේශපාලඥයින් වෙතින් ලැබී තිබූ බවත් බොහෝ නිවාසාධාරලාභීන් නියත වශයෙන්ම ආධාර ලැබීමට සුදුසු අඩු ආදායම්ලාභීන් නොවන බවත් මෙම වැඩසටහන විනිවිදභාවයකින් සිදුකර අරමුණු ලඟා කර ගෙන නොතිබූ බවත් නිරීක්ෂණය විය. තවද, ක්ෂේත්‍ර පරීක්ෂාවන් කල නිලධාරීන්ගේ ගමන් වියදම්, සංයුක්ත දීමනා හා ඉන්ධන වියදම් ඇතුළු අනෙකුත් සියළුම වියදම් ද නිවාස ආධාර ලෙස වාර්ෂිකව ලබා දී තිබූ ප්‍රතිපාදන මුදලින් වැය කර තිබුණි.	2024 ජනවාරි 26 දිනැතිව නිවාසාධාර ලබා දීම සම්බන්ධයෙන් වන උපදෙස් මාලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පමණක් වෙනස් කර එම දිනැතිවම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 06ක් වෙත නැවත යවා ඇති බව හා දකුණු පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් නිවාසාධාර ඉල්ලුම්පත් ප්‍රතිලාභින් වෙත විධිමත් පරිදි ලබා දීම සඳහා ආණ්ඩුකාර ලේකම් කාර්යාලය වෙත පමණක් ලබා දුන් බව.	ආධාර ලබාදිය යුතුම ප්‍රතිලාභීන් නිවැරදිව තෝරා ගැනීමටත් ඒ අනුව නිවාසාධාර ලබාදීමටත් කටයුතු කල යුතුය.

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ දකුණු පළාත් රාජ්‍ය නර්තන කණ්ඩායම සහ සංගීත කණ්ඩායම සහභාගී වන සියලුම සංගීත සංදර්ශන සඳහා පෞද්ගලික හා රජයේ ආයතන වලින් රේටයන් 02ක් යටතේ ගාස්තු අයකරනු ලැබුවද, ගාස්තු අයකිරීමකින් තොරව 2024 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා නර්තන ප්‍රසංග 45ක් හා සංගීත ප්‍රසංග 29ක් සඳහා සහභාගී වීම නිසා පිළිවෙළින් රු.1,658,500ක හා රු.990,000ක ආදායමක් අමාත්‍යාංශයට අහිමිවී තිබුණි.	රාජ්‍ය නර්තන කණ්ඩායම හා රාජ්‍ය සංගීත කණ්ඩායම ලබාදීමේ නිර්ණායක හා ක්‍රමවේදයන් මෙන්ම අයකරනු ලබන ගාස්තු සංශෝධනය සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	ගාස්තු නියමිත රේටයන් යටතේ අයකල යුතුය.

1.5.16 ශිර්ෂය 319 - දකුණු පළාත් සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

(අ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	කංචදේව ළමා නිවාසයේ නිල නිවාසය ඉදිකිරීම - III අදියර සඳහා ගාල්ල ප්‍රදේශයේ පිහිටි පුද්ගලික ආයතනයක් සමඟ රු.8,186,979ක (වැට් සහිත) වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණු අතර එහි ඉදිකිරීම් වැඩ 2021 දෙසැම්බර් 30 දින නිමකල යුතුව තිබූ නමුදු තවදුරටත් මාස 2කට වැඩි කාලයක් දීර්ඝ කර තිබියදීත්, අදාළ කොන්ත්‍රාත්කරු එහි වැඩ අතරමැද නවතා දැමීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුට අවස්ථා 03කදී රු.2,036,250ක මුදලක් ගෙවා තිබුණද, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 45ක් පමණ විය. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ රු.355,955ක් වටිනා කාර්යාධන බැඳුම්කරයෙහි වලංගු කාලසීමාව 2022 අගෝස්තු 02 දිනෙන් අවසන් වන බව දැනුවත් ව තිබියදී වගකිව යුතු නිලධාරීන් අවධානය යොමු	මෙම ගොඩනැගිල්ල භාවිතයට සුදුසු පරිදි සකස් කරගැනීම වෙනුවෙන් නව ඇස්තමේන්තුවක් සකස්කර දෙන ලෙස දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය වෙත දන්වා ඇති බව.	ගිවිසුම් ප්‍රකාරව කර්මාන්තය නිමකරවා ගැනීමට කටයුතු කල යුතුය.

නොකිරීම නිසා එමඟින් කොන්ත්‍රාත්කරුගෙන් අය කරගත හැකිව තිබූ මුදලද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. හම්බන්තොට දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය විසින් කර තිබූ ගණනය කිරීම්වලට අනුව ඉටු නොකරන ලද වැඩ කොටස් සම්බන්ධයෙන් රු.822,600ක මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට නිර්දේශ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල් අය කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම නව කොන්ත්‍රාත්කරු වෙත පළමු බිල්පත මඟින් රු.1,360,785ක් ගෙවා තිබුණු අතර විගණන භෞතික පරීක්ෂාවේදී මෙම ඉදිකිරීමෙහි ජනෙල්, දොරවල් හා උළුවහු සඳහා යොදා තිබුනු දැව ගුණාත්මකබවින් හා නිසි ප්‍රමිතියකින් තොර බවක් නිරීක්ෂණය වූයෙන් බිල් පත්‍රයෙහි වැඩ විෂය අංක 20, 26, 27, 28 යටතෙහි රු.449,630ක වටිනාකමක් ගෙවීම් කර තිබීම සාධාරණ නොවන බවද නිරීක්ෂණය විය.		

1.5.17 ශීර්ෂය 320 - දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

(අ) මුද්දර ගාස්තු ආදායම් පළාත් පාලන ආයතනවලට බෙදා හැරීම

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
1994 අංක 01 දරන දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය අනුව 1990 අංක 07 දරන දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය හා 1992 අංක 02 දරන දකුණු පළාත් මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ප්‍රකාර පළාත් සභාව විසින් දකුණු පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත පිහිටි යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් අයකර, එකතු කර දකුණු පළාතේ පළාත් සභා අරමුදලට ගෙවා ඇති අවස්ථාවක පළාත් සභාව විසින් ඒ	2024 දෙසැම්බර් 31 දිනට ශේෂය මුද්දර ගාස්තු රු.1,121,074,821 ක් හා උසාවි දඩ රු.65,320,914ක් වේ.එම ශේෂය මේ වන විට නිරවුල් කර ඇති බව.	1990 අංක 07 දරන දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කර මුද්දර ගාස්තු ආදායම් අදාළ පළාත් පාලන ආයතනවලට යොමු කිරීමට කටයුතු කල යුතුය.

මුද්දර ගාස්තුව අදාළ පළාත් පාලන ආයතන වෙත එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින සිට අවුරුදු 2 ක් වූ කාල සීමාවක් තුළ විෂයභාර අමාත්‍යවරයාගෙන් ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරන විට ඒ ඒ පළාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තුව හැරවිය හැකි වුවද, දකුණු පළාත් සභාවේ භාණ්ඩාගාරය විසින් විවිධ පළාත් පාලන ආයතනවලට ලබා දී නොතිබූ මුද්දර බදු ආදායම රු. මිලියන 1,121ක් විය.

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2023 පෙබරවාරි 09 දිනැති අංක 01/2023 දරන ප්‍රධාන ලේකම් (අයවැය) චක්‍රලේඛයේ 04(ඇ) හි කාර්ය මණ්ඩල පුහුණු සඳහා වන දේශීය පුහුණු අවස්ථා ලබා දීමේදී දක්වා ඇති විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී පුහුණු වැඩසටහන් 15ක් සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් එකතුව රු.2,285,775ක් ගෙවීම් කර තිබුණි.	කාර්ය මණ්ඩල පුහුණු සඳහා වන වියදම් යටතේ දේශීය පුහුණු අවස්ථා ලබා දීමේදී චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පුහුණුවීම් කටයුතු සිදුකල යුතුය.
(ii)	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01 දරන සේවා නියුක්ති ආදායමෙන්, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (අ.පු.ආ.බ) අඩුකිරීම සම්බන්ධයෙන් සේවා යෝජකයින් සඳහා වන උපදෙස් මාලාවෙහි 02 වන ඡේදය අනුව ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිලධාරීන් 16දෙනෙකු 2023 ජනවාරි සිට 2024 ඔක්තෝබර් 31 දින දක්වා කාලය තුළ දිරි දීමනා, සම්පත්දායක දීමනා සහ ප්‍රසම්පාදන කමිටු දීමනා වශයෙන් ලබාගෙන තිබුණු රු.2,768,559 ක මුදල සම්බන්ධයෙන් පුද්ගල ආදායම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම කාර්යාලයෙන් වෙනත් සේවා ආයතන වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගේ ආයතන ප්‍රධානීන් වෙත අදාළ නිලධාරින්ගෙන් හිඟ මුදල් අය කර, දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට වෙත ගෙවීම් කරන ලෙස හා විශ්‍රාම ගිය නිලධාරීන් විසින් ගෙවිය යුතු හිඟ මුදල් ගෙවීම් කර, ගෙවීම් තහවුරු කිරීමට ලිඛිතව දැනුම් දී ඇති බව.	උපදෙස් මාලාව ප්‍රකාරව කටයුතු කල යුතුය.

(ඇ) ප්‍රසම්පාදනය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මැදිහත් වී තෝරාගත් පාසල් සඳහා සුහුරු පන්ති කාමර සහ නවීන පරිඝණක විද්‍යාගාර 200ක් පිහිටුවීම වෙනුවෙන් 2022 මාර්තු 28 දින රු.මිලියන 300ක මූල්‍ය සීමාවකට යටත්ව ඉන්දු ශ්‍රී ලංකා රජයන් අතර එළැඹ තිබූ අවබෝධතා ගිවිසුම අනුව ප්‍රධාන ලේකම් ප්‍රමුඛ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත ප්‍රසම්පාදන කමිටුව විසින් ආයතන 2ක් තෝරාගෙන එම ආයතන සමඟ රු.238,078,697ක වටිනාකමකට 2024 මාර්තු ගිවිසුම්ගත වී තිබුණි. එක් එක් පැකේජයට අදාළ සාම්පල ඇගයීම සඳහා ඇණවුම් කිරීමට පෙර ඉදිරිපත් කිරීම අනිවාර්ය කොන්දේසියක් වුවද, එම සාම්පල ලද බවට හෝ පරීක්ෂා කළ බවට තොරතුරු නොවූ අතර 2024 ජුනි 19 දින එක් ආයතනයක් වෙතින් ඇනවුම් කරන ලද ටැබ්ලට් පරිඝණක 2200ක්ද Charging Station 200ක්ද Smart Board 200ක්ද දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබී තිබුණි. අනෙක් ආයතනය වෙතින් ඇනවුම් කරන ලද Wi-Fi access point for 30 user උපකරණ 200ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද ලැබී නොතිබූ අතර ගිවිසුම ප්‍රකාරව වසර 1 ½ කට අධික කාලයක් ගත වී තිබුණද ඇණවුම් කරන ලද භාණ්ඩ සපයා අවසන් කර නොතිබුණි.	ප්‍රසම්පාදනයේදී තාක්ෂණික උපකරණ ඇණවුම් කිරීමේදී විධිමත් ඇණවුමක් ලබාදීමකින් තොරව, ගිවිසුම් ගතවීමකින් හා කාර්ය සාධන සුරක්ෂණය ලබාගැනීමකින් තොරව sample පමණක් ලබාගැනීමක් සිදුකළ නොහැකි බැවින් විධිමත් ඇණවුමක් ලබාදී sample ඉල්ලුම් කර ඇති අතර ලැබී ඇති සාම්පල් පරීක්ෂා කිරීමට කටයුතු කර ඇති බව හා WIFI Access Point ඇණවුම් කිරීම ඉන්දියානු ආයතනයක් වෙතින් කළ යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය කාර්යයන් සිදු කර ඇති බවත් 2025 ජනවාරි 29 දින එම උපකරණ මෙම අමාත්‍යාංශය වෙත ගෙනවිත් ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන හා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ව්‍යාපෘතියේ අරමුණු ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) නොවිසඳී ඇති විගණන ඡේද

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමකින් තොරව ආණ්ඩුකාරවරගේ යෝජනාවක් මත දකුණු පළාතේ සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර තැපැල කළමනාකරණ පරිගණක වැඩසටහනක් නිර්මාණය කිරීම සඳහා 2020 ඔක්තෝබර් රු.14,008,176ක මුදලකට සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර 2021 වර්ෂයේ දී රු.27,984,663ක මුදලක් වැයකර තිබුණද, ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළ වැඩ අවසන් කර නොතිබුණි. එමෙන්ම මේ සඳහා රු.21,140,000කට ස්කැනර් යන්ත්‍ර 86ක් මිලට ගෙන තිබූ අතර ඉන් 70ක් 2022 දෙසැම්බර් මස 22 සහ 23 යන දිනයන්වල එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආයතන සඳහා බෙදා හැර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා එම යන්ත්‍ර ඵලදායී ලෙස ව්‍යාපෘතිය සඳහා යොදවා ගැනීමටත් ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු කර ගැනීමටත් නොහැකි වී තිබුණි.	තැපැල් පද්ධතිය අවසන් කර භාරදී නොමැති බැවින්, ඉතිරි මුදල් ගෙවිය නොහැකි බවත්, ඊට අදාළ ගිවිසුම් කාලය අවසන් වී ඇති බවත් දන්වමින් 2025 මාර්තු 14 දිනැතිව අදාල ආයතනය වෙත ලිපියක් යොමු කරන ලද අතර, ඊට එම ආයතනයෙන් 2025 අප්‍රේල් 17 දින මෙම කාර්යාලය වෙත ලැබුණු පිළිතුරු ලිපියට අනුව ඉදිරි කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ ලබා දෙන ලෙස නීති අංශය වෙත යොමු කර ඇති බව.	ව්‍යාපෘතිය සිදුකිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ඒ අනුව කටයුතු කල යුතු අතර තැපැල කළමනාකරණ පද්ධතිය ඵලදායී ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ii)	ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඉදිරිපස පැති බැම්ම ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයට රු.37,362,532ක වැට් බදු රහිත මිලකට ප්‍රදානය කර තිබුණු අතර එයට වැට් බදු ලෙස රු.2,989,002ක හා රු.3,735,465ක හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදනද සමඟ රු.44,087,000 මුළු වටිනාකම් මුදලකින් සමන්විත විය. කර්මාන්තය 2021 අගෝස්තු 03 දින ආරම්භ වී 2022 මාර්තු 31 එනම් දින 240 ක කාලයකින් නිම කළ යුතු විය. නමුත් 2022 වර්ෂයේදී අවස්ථා 02 කදී මාස 4 ½ ක දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, කර්මාන්තය කරගෙන යන අතරතුර 2022 අගෝස්තු 02 දින සිට ඉදිකිරීම් නතර කර කර්මාන්තයේ ඉතිරි වැඩ කොටස් දෙවන අදියර වශයෙන් සලකා නව කොන්ත්‍රාත්තුවක් ලෙස ඉහත දක්වා ඇති ආයතනයටම රු.34,368,110ක බදු රහිත මිලකට පවරා	ඉංජිනේරු සේවා කාර්යාලය මඟින් ස්වාධීන පරීක්ෂණයක් සිදු කර දෙන ලෙස 2024 නොවැම්බර් 18 දිනැති ලිපියෙන් ඉල්ලීමක් කර ඇති බව.	අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.

තිබුණි. එය බදු සඳහා රු.4,124,173ක් අවිනිශ්චිත ප්‍රතිපාදන (10%) රු.3,436,811ක් හා මිල වැඩිවීම (10%) සඳහා රු.3,436,405ක් ලෙස මුළු පිරිවැය රු.45,365,499ක් වූ අතර 2022 දෙසැම්බර් 20 දින නිම කළ යුතුව තිබුණද අවස්ථා 03 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම් සමඟ 2023 මාර්තු 31 දින කර්මාන්තයේ වැඩ අවසන් කර තිබූ අතර පළමු හා දෙවන කොන්ත්‍රාත්තුවට අදාළව රු.16,326,201ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබූ අතර එය වැට් බදු සමඟ රු.18,775,131ක් බව නිරීක්ෂණය විය.

1.5.18 ශීර්ෂය 322 දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

(අ) අවිධිමත් ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(i)	දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාල තාප්පයේ දකුණු පස කොටසේ wire max යොදා (දැල් ආවරණය සහිතව) වැටක් එම කාර්යාලයේ සේවය කරන අයකු ලවා ඉදිකර, ඒ වෙනුවෙන් ආයතනයක් සමඟ 2024 අගෝස්තු 15 දින රු.729,000කට ගිවිසුම් ගත වී රු.271,350ක් ගෙවා තිබූ නමුත් “ගාලු කොටුව විශේෂ නියමතා කලාපය සඳහා සකස් කර ඇති සැලසුම් රෙගුලාසිවල 14.1 ට” අනුව සියළුම ගොඩනැගිලි සහ භූමිවල මාර්ගවලට මුහුණ දී ඇති පැතිවල මායිම් තාප්ප හා දැල්වැට ඉදිකිරීම සඳහා අවසර ලබා දී නොතිබුණි. අත්‍යවශ්‍ය කාර්යයවලින් බැහැරව අරමුණගත නෛතික නොවන කටයුතු සඳහා මුදල් වැය කිරීමට රු.1,047,513ක ඇස්තමේන්තු වටිනාකමක් සඳහා ප්‍රතිපාදන සැලසීම ගැටළු සහගත විය.	ආරක්ෂිත වැට ඉදි කිරීම සඳහා ඉල්ලීම් කර තිබියදී කාර්යාලයේ ඉදිරිපස පවත්නා තාප්පයේ උස නොඉක්මවන පරිදි තාප්පයට ඇතුළතින් තාවකාලික දැල් වැටක් යෙදීමට අවසර ලබා දී ඇති බවත් මෙම ව්‍යාපෘතිය සඳහා නි.ප්‍ර.ලේ.කාර්යාලයේ හා ප්‍රධාන ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා තාක්ෂණික කමිටු නිර්දේශ ලබා ගනිමින් පෞද්ගලික ආයතනයකට කර්මාන්තය පවරා ඇති බව.	ආර්ථික හා මූල්‍ය තත්ත්වය මත ඵලදායී හා අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා පමණක් මුදල් වැය කල යුතුය.
(ii)	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024හි 4.2ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන	මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් සිදු කිරීම සඳහා කමිටුවක් 2025 මාර්තු 03 දිනැති හා අංක CSS/2/2/232 දරන දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපිය	චක්‍රලේඛ ප්‍රකාරව මාසික ප්‍රවාහන දීමනාව ලබා ගන්නා නිලධාරීන්ට සංචිත වාහන ලබාදීම නොකල යුතු අතර පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කිරීමටත් ආයතන සංග්‍රහය

ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ හිටපු ගණන් දීමේ නිලධාරීයා විසින් සති අන්ත දිනවල පෞද්ගලික ගමන් සඳහා සංචිත වාහන රැගෙන ගොස් ඔහු විසින් ධාවනය කර රියදුරන් ලවා දෛනික ධාවන සටහන්වලට කාර්යාලයේ වැඩබිම් සඳහා ධාවනය කළා සේ සටහන් කොට ඊට ඉංජිනේරු සහකාරවරයෙකුගේ අත්සන් යොදා තිබීමෙන් හා නිල වාහන හිමිකම් හා ඉන්ධන දීමනාව ලබා ගනිමින් සති අන්ත දිනවල ආයතනයේ සංචිත වාහන භාවිතා කිරීමෙන් එම නිලධාරියා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කොටසේ 31.1.12 හි සඳහන් විෂමාචාර සිදු කිරීම පිළිබඳව විනය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මඟින් පත් කර ඇති බව හා එම කමිටු වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා බව.	ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කල යුතුය.

1.5.19 ශීර්ෂය 324 - දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) සහ 154 (ඊ) 02 ව්‍යවස්ථාවන් මඟින් දකුණු පළාත් ආණ්ඩුකාරවර වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1990 අංක 7 දරන දකුණු පළාත් මුදල් ප්‍රඥප්තියේ XXV පරිච්ඡේදයේ අංක 80 දරන වගන්තිය යටතේ අභියාචනා විභාග කිරීම සඳහා 2023 ජුනි 21 දින සිට තුන් අවුරුදු කාලයකට බලපැවැත්වෙන පරිදි සභාපති ඇතුළු සාමාජිකයින් ලෙස රජයේ විශ්‍රාමික නිලධාරීන් සිව් දෙනෙකුද කමිටුවේ ලේකම් ලෙස රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙකුද පත් කර එම සමාලෝචන කමිටුව 2023 ජූලි මස සිට 2024 ඔක්තෝබර් 02 දින දක්වා එක් ලිපිගොනුවකට අදාළව පමණක් රැස්වීම් වාර 30ක් පැවැත්වීම නිසා කමිටු දීමනා ලෙස එකතුව රු.461,500ක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ගෙවා	මෙම කමිටුව පත්කිරීම, සමාලෝචන මණ්ඩලය පැවැත්වීම, සැළසුම් කිරීම හා ක්‍රමවේදය පිළිබඳ බලපෑමක් කිරීම හෝ පාලනය කිරීම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ නොහැකි බව.	යම් කාල රාමුවක් තුළ කටයුතු කිරීමට අවශ්‍ය නිසි ක්‍රමවේදයන් සැකසිය යුතුය.

තිබුණි. සමාලෝචන මණ්ඩලයට ඉදිරිපත් කරන ලද කාර්යයන්ට අදාළව යම් කාල රාමුවක් තුළ කටයුතු කිරීමට අවශ්‍ය නිසි ක්‍රමවේදයන් සකසා නොතිබීම නිසා පළාත් සභා අරමුදල් ඵලදායී නොවන ලෙස එකම කාර්යයක් වෙනුවෙන් අවස්ථා 30කදී වැය කිරීමට සිදුවී තිබුණි.

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දකුණු පළාත හැර වෙනත් පළාත්වල නොතාරිස්වරුන් විසින් 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලය තුළ එකතුව රු.157,878,400ක වටිනාකමැති ඉඩම් හුවමාරු අවස්ථා 27 කට අදාළ ඔප්පු ලියාපදිංචි කිරීම් සම්බන්ධයෙන් ගොනු විවෘත කර අදාළ මුද්දර ගාස්තු නියමිත පරිදි ගෙවා ඇත්දැයි පරීක්ෂා කර හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට හම්බන්තොට පළාත් ආදායම් ප්‍රාදේශීය කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.	ලිපිගොනු විවෘත කිරීම සඳහා අදාළ ඔප්පු පිටපත් අවශ්‍ය බැවින් අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙතින් සිහි කැඳවීම් කළද මෙතෙක් එම පිටපත් ලැබී නොමැති බව.	හිඟ මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ii)	2013 අංක 01 දරන දකුණු පළාත් සභාවේ බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 3 (1) වන වගන්තිය ප්‍රකාරව බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උකස් මධ්‍යස්ථාන 02ක්ද හම්බන්තොට දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමූපකාර සමිති 07 කට අයත් සමූපකාර ග්‍රාමීය බැංකු 72 ක්ද බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි.	බලපත්‍ර ලබා ගන්නා ලෙස දැනුම්දී අදාල ආකෘති පත්‍රද ලබා දී ඇතත් මෙතෙක් බලපත්‍ර ලබා ගෙන නොමැති බව.	උකස් ව්‍යාපාර පවත්වාගෙන යාමට අදාළව ප්‍රඥප්තියෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(iii)	දකුණු පළාත් සභාවේ 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ XVII පරිච්ඡේදයේ 52 ඡේදය සහ දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ මුද්දර ගාස්තු කාර්ය පටිපාටියේ 1.2.4 ඡේදය ප්‍රකාරව තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2024 අගෝස්තු 28 දින හම්බන්තොට පළාත් ආදායම් ප්‍රාදේශීය කාර්යාලය වෙත එවා තිබුණු 2023 ජූලි සිට දෙසැම්බර් දක්වා වූ මාස 06කට අදාළ ඔප්පු 52ක් සඳහා	ඔප්පු 52 අතුරින් ලිපිගොනු 13කින් පළමුවරද, 20කින් දෙවනවරද කැඳවීම් කර ඇති අතර ස්ථානීය පරීක්ෂණය සඳහා ලිපිගොනු 02කින්ද ප්‍රමාද හා අතිරේක තක්සේරු නිකුත් කරන ලද ලිපිගොනු 14ක්ද කැඳවීම් කර මෙතෙක් නොපැමිණි ලිපිගොනු 02 ක් හා දීමනාකරුට යැවූ නමුත් නැවත ලිපි ලැබී ඇති ලිපිගොනු 01	අදාල ලිපිගොනු විවෘත කර දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය.

රු.1,199,200ක මුද්දර ගාස්තු ප්‍රමාදව ගෙවීම සම්බන්ධයෙන් ලිපිගොනු විවෘත කර දඩ මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.	ක්ද වශයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	

(ඇ) හිඟ ආදායම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් මූල්‍ය රීති 116.1 අනුව හිඟ ආදායම් අයකර ගැනීම පිළිබඳව ආදායම් රැස්කරන නිලධාරීන් අවධානයෙන් හා ඉතා සැලකිලිමත්ව සිටිය යුතු අතර නීති මාර්ගයෙන් හෝ වෙනත් මාර්ග වලින් හෝ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආදායම් සංකේත 04කට අදාළව අයකර ගැනීමට ඇති සමස්ථ හිඟ මුදල රු.මිලියන 289.3 ක් වූ අතර එම මුදල තුල අවුරුදු 03 ඉක්මවූ රු. මිලියන 137.8 ක හිඟ ආදායමක් විය.	නඩු පවරා නොමැති හිඟ බදු සම්බන්ධයෙන් 1990 අංක 07 දරන දකුණු පළාත් සභාවේ මුදල් ප්‍රඥප්තිය අනුව අය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු අතර අයකල නොහැකි ආදායම් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඈ) නොවිසඳී ඇති විගණන ඡේද

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	පෞද්ගලික තේ කර්මාන්ත ශාලාවක් සතු වූ ඉඩම වෙනත් පාර්ශවයකට පැවරීමට අදාළව පළමු තක්සේරු වටිනාකම රු.354,150,000 ක්ද අභියාචනයෙන් කළ පසු දෙන ලද තක්සේරු වටිනාකම රු.276,000,000ක් වීමෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සමාන ශ්‍රේණියක නිලධාරීන් දෙදෙනෙකු අවස්ථා දෙකකදී දෙන ලද තක්සේරු වටිනාකම් අතර රු.78,150,000ක තක්සේරු වටිනාකම්වල වෙනසක් පැවතුණි. මෙම ඉඩම සම්බන්ධයෙන්ම පළාත් ආදායම් කොමසාරිස් විසින් පත්කරන ලද විශේෂ කමිටුවක් විසින් නැවත තක්සේරුවක් පසුව ලබා දී තිබූ අතර ඒ අනුව එහි දේපල රු.248,000,000ක් ලෙස තක්සේරු කර තිබුණි. එසේම තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් එම දේපල තක්සේරු කර අගයන් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමකට අනුව	තක්සේරු නිලධාරීන්ගේ අභිමතය පරිදි තක්සේරු වටිනාකම් ලබා දීම සම්බන්ධව පැන නැගී තිබූ ගැටළු අවම කරමින් සුදුසු නිර්නායක හඳුන්වා දීම, අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි, තොරතුරු රැස්කිරීම පිළිබඳ සියලු උපදෙස් ලබා දෙමින් මෙවැනි තත්ත්වයක් ඇති නොවන පරිදි දැනට දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටින බව.	වත්කම් තක්සේරුව නිශ්චිත නිර්ණායක පදනම් කර ගෙන සංගතභාවයකින් යුතුව කල යුතුය.

එම දෙපර්තමේන්තුව විසින් සිදුකරන ලද රු.240,000,000ක අගයකට තක්සේරු කර තිබුණි. ඒ අනුව දේපල තක්සේරු කිරීමේ කාර්යය සඳහා විධිමත් නිර්ණායක සකස් කිරීමකින් තොරව එක් එක් නිලධාරියාගේ අභිමතය පරිදි තක්සේරු වටිනාකම් දීම අවිධිමත් තත්ත්වයක් වන බැවින් දේපළ තක්සේරුව පිළිගත හැකි විධිමත් ක්‍රමවේදයක් හා නිර්නායක හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි.		
(ii) පෞද්ගලික ආයතනයක් සතු දේපල තවත් පෞද්ගලික ආයතනයක් වෙත පැවරීමේදී නිශ්චල දේපල ලෙස රු.104,000,000ක් වූ තේ කර්මාන්ත ශාලාව (ගොඩනැඟිලි සහ වගාවන් සහිත ඉඩම ඇතුළුව) සහ චංචල දේපල ලෙස රු.232,000,000ක් වූ යන්ත්‍ර සූත්‍ර හා සවිකිරීම්ද රු.16,000,000ක් වූ වාහන සහ රු.12,000,000ක් වූ වෙළඳ ලාභය ලෙසද වර්ගීකරණය කර කෙටුම්පත් ගිවිසුමක්ද ඉදිරිපත් කර මත සහතික ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රයක් 2023 ජනවාරි 09 දින පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ අයදුම්පත්‍රය අනුව පළාත් ආදායම් කොමසාරිස් විසින් පත් කරන ලද කමිටුව විසින් 2023 ජනවාරි 31 දින සියළු දේපලවල වටිනාකම රු.243,000,000ක්ද ගෙවිය යුතු මුද්දර ගාස්තුව රු.9,719,000ක්ද ලෙස දක්වමින් මත සහතිකයක් ලබා දී තිබුණද ඊට එකඟ නොවීම මත අයදුම්කරු විසින් 2023 පෙබරවාරි 09 දින අභියාචනාවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අභියාචනා විභාගයක් පවත්වා තිබුණද, එයට එකඟතාවය පල කර නොතිබුණු බැවින් ඉහත ප්‍රඥප්තියේ 79(11) වගන්තිය ප්‍රකාරව ගෙවිය යුතු මුද්දර ගාස්තුව දින 07ක් තුළ සම්පූර්ණ කිරීමට දැනුම් දී තිබුණද, අයදුම්කරු ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ අනුව එසේ නොගෙවන ලද රු.9,719,000ක් වූ මුද්දර ගාස්තුව මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව පැහැර හැර ඇති මුද්දර ගාස්තුවක් ලෙස නිරීක්ෂණය වන අතර එකී මුද්දර ගාස්තු අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.	අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනාව සම්බන්ධව ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා නීතිපති විමසීම්ද සිදු කර ඇති අතර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.4,104,123,843 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.850,674,421ක ඌනතාවයක් විය.

3. ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

3.1 ප්‍රඥප්ති ගිණුම් / අරමුදල් ගිණුම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් සභාව තුළ වූ ප්‍රඥප්තිගත ආයතන සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදන එම ආයතනවල අරමුණු හා කාර්යයන් ඉටුකිරිම සඳහා යෙදවිය යුතු වුවත්, රු.782,233,618ක් වූ අරමුදල් එකී අරමුණු සඳහා යෙදවීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අදාළ මුදල් ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය.

3.2 අනෙකුත් අත්තිකාරම් ගිණුම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂය රු.1,929,281,694ක් ලෙස දක්වා තිබූ අතර ඉන් ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය, මියගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 2378 දෙනෙකුගෙන් එකතුව රු.57,124,095ක් වූ ණය ශේෂ තවදුරටත් අයවිය යුතුව පැවතුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව.	අයවිය යුතු ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 රජයේ ප්‍රදාන

මූලාශ්‍රය	අනුමත මුදල රු.	වැයකළ මුදල රු.	ඌන උපයෝජනය රු.
පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG)	2,249,000,000	1,711,030,828	537,969,172
උපමාන පාදක ප්‍රදාන (CBG)	505,000,000	402,235,167	102,764,833

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාත් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ මධ්‍යම රජයේ ප්‍රදාන ලෙස පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) සහ උපමාන පාදක ප්‍රදාන (CBG) සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 2,249 ක් හා රුපියල් මිලියන 505ක ප්‍රතිපාදන අනුමත කර, එම ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රුපියල් මිලියන 1,711ක හා රුපියල් මිලියන 402ක ප්‍රතිපාදන පමණක් සමාලෝචිත වර්ෂය තුළදී වැයකර තිබීම නිසා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන සඳහා ලද මුදල් වලින් පිළිවෙලින් රුපියල් මිලියන 538 ක් හා රුපියල් මිලියන 103ක් ඌන උපයෝජිතව පැවතුණි.	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන (PSDG) හා උපමාන පාදක ප්‍රදාන (CBG) යටතේ ඌන උපයෝජනය රු. මිලියන 641ක් බව.	සැලසුම් කල පරිදි ප්‍රතිපාදන උපරිමයෙන් උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

4.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු. මිලියන 2,690.56ක ඇස්තමේන්තු වටිනාකමකට වූ යෝජනා 1406 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත පරිදි විය.

විස්තරය	නව වැඩ යෝජනා ගණන	අවිච්ඡේද යෝජනා වැඩ ගණන	මුළු වැඩ යෝජනා ගණන	මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන
(i) සියයට 50 කට වඩා වැඩියෙන් නිම කළ	96	01	97	450.40
(ii) සම්පූර්ණයෙන් නිම කළ	1208	06	1214	1,947.88
(iii) සියයට 50 කට වඩා අඩුවෙන් නිම කළ	61	-	61	255.85
(iv) ආරම්භ කර නොතිබූ	34	-	34	36.43
	-----	----	----	--------
එකතුව	1399	07	1406	2,690.56
	===	==	===	======

මේ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ පළාත් නිශ්චිත සහ උපමාන පාදක වැඩසටහන යටතේ අනුමත වූ වැඩ යෝජනා 1406හි ප්‍රගතිය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ යෝජනා 1214ක වැඩ සම්පූර්ණයෙන් අවසන් කර තිබුණු අතර වැඩ යෝජනා 158ක් ක්‍රියාත්මක වෙමින් පැවති බවද වැඩ යෝජනා 34ක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ ඒ අමාත්‍යාංශ මඟින් එකී වැඩ යෝජනා අවසන් කිරීම සම්බන්ධ අධීක්ෂණය හා පසු විපරම් කටයුතු විධිමත් පරිදි ප්‍රමාණාත්මක මට්ටමින් සිදුවී නොතිබුණි.	එක් එක් අමාත්‍යාංශ මඟින් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා සැලසුම් ලේකම් කාර්යාලය වෙත වාර්තා කරනු ලබන අතර ඒ අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පසු විපරම් කටයුතු සිදුකරන බව හා කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් සැලසුම් ලේකම් කාර්යාලය මඟින් සිදුකරන බව.	පසු විපරම් කටයුතු විධිමත් පරිදි සිදුකල යුතු අතර සැලසුම් කල වැඩ යෝජනා වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කිරීමට කටයුතු කල යුතුය.

(ආ)	පළාත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ මූලික අරමුණ වනුයේ පළාත තුළ ප්‍රමුඛතාවයන් ලබාදිය යුතු විශේෂයෙන් පළාත් ආදායම ඉහළ නැංවීමට අදාළ ව්‍යාපෘති හඳුනාගෙන ප්‍රමුඛ අවශ්‍යතා අනුව ලේඛනගත කිරීමයි. වර්ෂය තුළ සකස් කර තිබූ පළාත් සංවර්ධන සැලැස්මේ වූ සංවර්ධන ව්‍යාපෘති සංශෝධනය සඳහා යම් කාලවකවානුවක් නිර්ණය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම සංශෝධනයන් සිදු කර තිබුණි.	ව්‍යාපෘති අනුමත කිරීමේ දී ව්‍යාපෘති සංශෝධනය කිරීම සඳහා ලබා දී ඇති කාලය 2024 අගෝස්තු 30 දින දක්වා දන්වා තිබුන ද විවිධ කරුණු හේතුවෙන් ව්‍යාපෘති සංශෝධනය කිරීමට සිදු වූ බව.	ඉටුකළ හැකි ව්‍යාපෘති නිවැරදිව හඳුනාගෙන සංවර්ධන සැලැස්ම පිළියෙල කල යුතුය.

4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

4.2.1 පළාත් සභා ආයතනවල කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන් (අධ්‍යාපන හා සෞඛ්‍ය හැර) පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව		පුරප්පාඩු සේවක සංඛ්‍යාව	අතිරික්ත සේවක සංඛ්‍යාව
			ස්ථිර	අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්		
(i)	පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු	46,404	46,132	237	05	-
(ii)	පළාත් පාලන ආයතන	5,868	5,988	129	-	249
(iii)	ප්‍රඥප්ති මඟින් පිහිටවූ ආයතන	595	405	13	177	-
	එකතුව	52,867	52,525	379	182	249

විගණන නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	රුහුණු සංචාරක කාර්යාංශයේ ප්‍රධාන කළමනාකරණ සහකාර ලෙස රාජකාරී සිදුකරනු ලබන නිලධාරියා 2006 වර්ෂයේ සිට කළමනාකරණ සහකාර ලෙසද 2019 ජනවාරි 04 දින සිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත නොවූ ප්‍රධාන කලමනාකරණ සහකාර තනතුරෙහි වැඩ ආවරණය කිරීමේ රාජකාරී සඳහා පත්කර වසර 18ක් සේවය කර තිබූ අතර 2023 දෙසැම්බර් 01 දිනැති අංක 03/2023 දරන ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛය හා දකුණු පලාත් සභා නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු චක්‍රලේඛයේ අංක 3.1 ඡේදයට අනුව ස්ථාන මාරුවීම් ලබාදීමටද කටයුතු කර නොතිබුණි.	ප්‍රධාන කළමනාකරණ සහකාර තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත නොවූ තනතුරක් වන අතර කාර්යාලයේ කාර්යයන් පහසු කර ගැනීම සඳහා අභ්‍යන්තර පාලන උපක්‍රමයක් ලෙස පත් කරන ලද නාමික තනතුරක් බව හා ප්‍රධාන කළමනාකරණ සහකාර වශයෙන් සේවය කිරීමේදී අමතර වැටුප් හා දීමනා ගෙවනු නොලබන බවත් මෙම නිලධාරියා 2025 වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර ඇති බැවින් එයට අදාල ස්ථාන මාරු නියෝග ලද පසු ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ii)	කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් නිෂ්පාදන ආයතන සඳහා ස්ථාන භාර නිලධාරීන් ලෙස පරගහතොට මැටි නිෂ්පාදන ආයතනයට, වල්ගම රුහුණු රන්සළු ආයතනයට සහ දෙනිපිටිය කොහු ආයතනයට, අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂ දැනුමක් නොමැති නිලධාරීන් පත්කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව.	විෂය දැනුමක් සහිත නිලධාරීන් ස්ථානභාර නිලධාරීන් ලෙස පත් කල යුතුය.

4.2.2 පාසල් කාර්ය මණ්ඩලය

දකුණු පළාත් සභා පාසල්වල පවතින විදුහල්පතිවරු, ගුරුභවතුන් හා සහයක කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව	අතිරික්ත සේවක සංඛ්‍යාව
(i)	විදුහල්පතිවරු /නියෝජ්‍ය විදුහල්පතිවරු/ සහකාර විදුහල්පතිවරු	1347	1122	225	-
(ii)	ගුරුභවතුන්	23596	22993	603	-
(iii)	සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය	4103	6581	-	2478
	එකතුව	29046	30696	828	2478

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	තත්කාලය සඳහා බලපැවැත්වෙන පරිදි දකුණු පළාත් සභා පාසල් සඳහා ගුරු මාරු පටිපාටියක් සකස් කර අනුමත කර නොමැති අතර, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය මඟින් ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා මඟ පෙන්වන මූලික කරුණු ඇතුළත් උපදෙස් මාලාවක් නිකුත් කොට තිබුණද, එහි 3.2 වගන්තියෙහි ගුරුභවතුන්ගේ සේවා කාලය නියම කිරීම සඳහා වන උපදෙස් නිසි පරිදි අනුගමනය කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ii)	දකුණු පළාත් අධ්‍යාපන ලේකම් අනුමත කළ විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටියේ 5.3 වගන්තියට පටහැනිව ගාල්ල ප්‍රදේශයේ එක් විද්‍යාලයක විදුහල්පතිවරයා විදුහල්පති සේවයට පත්වූ 2009 නොවැම්බර් 17 දින සිට අඛණ්ඩව වසර 15කට ආසන්න කාලයක් එකම පාසලක සේවයේ යෙදවීමට කටයුතු කර තිබුණි.	ශ්‍රේණිධාරී විදුහල්පති පත්වීම්හි බලධාරියා අධ්‍යාපන අමාත්‍යාංශය වන අතර එම පත්වීම් ස්ථානගත කරන්නේ හා ස්ථාන මාරු වීම් සිදු කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වන බැවින් ස්ථාන මාරු සම්බන්ධයෙන් මේ වන විට නිර්දේශ කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව.	වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය ප්‍රකාරව කටයුතු කල යුතුය.

4.2.3 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේ අනුමත කරන ලද කාර්ය මණ්ඩලය සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

සේවක වර්ග	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෝෂ්ඨ මට්ටම	1369	1190	179
තෘතියික මට්ටම	195	90	105
ද්විතියික මට්ටම	5288	4766	522
ප්‍රාථමික මට්ටම	3255	2955	300
	---------	--------	---------
	10107	9001	1106
	======	=====	=====

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
එක් එක් සේවා ගණයන්වල පැවති 1106 ක් වූ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	දකුණු පළාත සඳහා අවශ්‍ය අනුමත කාර්ය මණ්ඩල ප්‍රමාණය සම්පූර්ණ කරන ලෙසට නිරන්තර ඉල්ලීම් කර ඇති බව.	පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුය.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මහජන සේවා ඉටු කිරීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දකුණු පළාතේ පළාත් පාලන ආයතන 49 න් 17 ක විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොවීමෙන් "සෑම පළාත් පාලන ආයතනයකම විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීම" යන අරමුණ ඉටුකර ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව අසමත්ව තිබුණි.	ඇතැම් පළාත් පාලන ආයතන සඳහා ඉඩම් නොමැති වීම, සේවක හිඟය, මහජන විරෝධතා ,විධිමත් කසළ කළමනාකරණය සඳහා යන්ත්‍ර සූත්‍ර හා වාහනවල හිඟබව, නවීන තාක්ෂණ නොමැතිවීම ආදී කරුණු හේතුවෙන් විධිමත් කසළ කළමණාකරණයක් සිදුකිරීමට බාධා පැමිණ ඇති බව.	පළාත් පාලන ආයතනවල විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කල යුතුය.

5.2 අයවැය ලේඛනමය පාලනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වියදම් ශීර්ෂ 26කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනවලින්, එකතුව රු.5,695,139,004 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එම අගයයන් රු.1,489,895 සිට රු. 1,614,696,667ත් අතර පරාසයක පැවතුණි.	සැපයුම් සේවාවන් වෙනුවෙන් වූ වියදම් සීමා කිරීම වර්ෂය තුලදී වවුචර්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් බැරකම් මඟින් ගෙවීම් කිරීමට සිදුවීම, මෘදුකාංග සංවර්ධන කටයුතු පළාත් ග්‍රාම සංවර්ධන අරමුදල මගින් සිදු කිරීම, පසුගිය වසරට සාපේක්ෂව නඩත්තු වියදම් අඩු වීම, අලාභහානි නොමැති වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වීම, ගොඩනැගිලි අත්පත් කර ගැනීමට අදාළ කටයුතු සිදු නොවීම යනාදී හේතු මේ සඳහා බල පෑ බව.	අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගත යුතුය.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේදී ප්‍රාදේශිය සභා යටිතල පහසුකම් සංවර්ධනය, සනීපාරක්ෂක පහසුකම් සහ ඝන අපද්‍රව්‍ය කළමණාකරණය, පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම, ධාරිතා සංවර්ධනය හා මානව සම්පත් සංවර්ධනය, නීතිය හා නියාමනය ක්‍රියාත්මක කිරිම යනාදී වශයෙන් ඉලක්ක 44ක් ලඟා කර ගැනීමට අපේක්ෂිත බව දක්වා තිබුණද, එම ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සහකාර කොමසාරිස් කාර්යාල විසින් ඉටු කළ යුතු කාර්යයභාරය නිශ්චිතව විමධ්‍යගත වන ආකාරයට ක්‍රියාකාරී සැලැස්මක් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණ බැවින් දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය අරමුණු ඉටු කරගැනීම උදෙසා සහකාර කොමසාරිස් කාර්යාලවලින් සපයන ලද දායකත්වය මැන බැලීමේ නිසි ක්‍රමවේදයක් නොතිබිණි.	පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම අනුව සකස් කරන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් කාර්යාලය හරහා ක්‍රියාත්මක වන බැවින් දිස්ත්‍රික් සඳහා වෙන් වෙන්ව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු නොලබන බව.	සහකාර කොමසාරිස් කාර්යාල විසින් ඉටු කළ යුතු කාර්යයභාරය නිශ්චිතව විමධ්‍යගත වන ආකාරයට ක්‍රියාකාරී සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර එම කාර්යාලවලට ලබාදී කාර්ය සාධනය මැන බැලීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කල යුතුය.